# Status and trends of traditional knowledge-based forest life practices: A case study of Nilgala savanna floristic zone in Sri Lanka

**Karunarathna, M.**


## Abstract

The relationship between humans and forests extends back to the beginning of human evolution. It can be observed that the temporal and spatial dynamics of this relationship have resulted in the creation of traditional knowledge systems related to forests. The research problem of this study is, why do we need to reconsider the effectiveness of traditional knowledge-based forest life practices for savanna forest conservation and management? The main objective of the research was to investigate the status and trends of traditional knowledge-based forest life practices of the peripheral communities of the Nilgala savanna floristic zone in Sri Lanka. The qualitative research methodology was used and the research was conducted in Karandugala and Nilgala Grama Niladhari divisions. Semi-structured interview and direct observation methods were used to collect the primary data. The data were analyzed using the narrative analytical method. According to the findings, it is evident that the Nilgala forest community collects non-timber forest products using their traditional knowledge. These traditional knowledge practices are challenged due to wildlife and forest conservation laws and regulations as well as external social, political and economic influences. Moreover, this has affected the structure and productivity of the forest. This type of a situation and trends invite for research that could connect the natural sciences and social sciences together towards a sustainable perspective.


**Keywords:** Nilgala, Peripheral communities, Savanna, Traditional knowledge

# සාම්ප්‍රදායික දැනුම් පද්ධති සමඟ බැඳුණු වනගත ජීවන ව්‍යවහාරවල තත්ත්ව සහ ප්‍රවණතා: නිල්ගල සැවනා වෘක්ෂලතා කලාපය ඇසුරිනි


## සංක්ෂේපය

මිනිසා සහ වනාන්තර අතර සබඳතාව මානව විකාශනයේ ආරම්භය දක්වා ඈතට විහිදේ. එම සබඳතාවේ සහ ජීවන ව්‍යවහාරවල කාල අවකාශීය ගතිකයන් නිරීක්ෂණය කළ හැකි අතර ම වනාන්තරය සම්බන්ධ සාම්ප්‍රදායික දැනුම් පද්ධතියක් නිර්මාණය වීම මෙම සබඳතාවේ ප්‍රතිඵලයකි. මේ අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව වන්නේ සැවනා වනාන්තර සංරක්ෂණය සහ කළමනාකරණය සඳහා සාම්ප්‍රදායික දැනුම පදනම් කරගත් වනගත ජීවන ව්‍යවහාරවල ඵලදායීතාව නැවත සලකා බැලිය යුත්තේ ඇයි? යන්න යි. මෙම අධ්‍යයනය ශ්‍රී ලංකාවේ සුවිශේෂී වනාන්තර කලාපයක් වන නිල්ගල වනාන්තර පර්යන්ත ප්‍රජාවගේ සාම්ප්‍රදායික දැනුම මත පදනම් වූ ජීවන ව්‍යවහාරවල තත්ත්ව හා ප්‍රවණතා විමර්ශනය කිරීම අරමුණු කරගනියි. නිල්ගල වනාන්තර පර්යන්තයේ කරාඬුගල හා නිල්ගල ග්‍රාම නිලධාරී වසම් ඇසුරින් මෙම අධ්‍යයනය සිදු කර තිබෙන අතර ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කර ඇත. මෙම අධ්‍යයනයේ දත්ත රැස්කිරීම සඳහා අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා සහ ඍජු නිරීක්ෂණය යන විධික්‍රම භාවිත කර ඇත. දත්ත හා තොරතුරු විශ්ලේෂණය සඳහා ආඛ්‍යාන විශ්ලේෂණය විධික්‍රමය භාවිත කොට ඇත. මෙම අධ්‍යයනයට අනුව නිල්ගල වනාන්තරය පර්යන්ත ප්‍රජාවගේ වනජ රැස්කිරීමේ ක්‍රියාවලිය සාම්ප්‍රදායික දැනුම මත පදනම් වන අතර වනජීවී සහ වන සංරක්ෂණ නීති-රීති හා බාහිර සමාජ, දේශපාලන හා ආර්ථික බලපෑම් හේතුවෙන් මෙම යෙදීම් අභියෝගයකට ලක්ව තිබේ. එපමණක් නොව, එය වනාන්තරයේ ව්‍යුහය හා ඵලදායීතාව කෙරෙහි ද බලපෑම් ඇති කරයි.


**ප්‍රමුඛ පද-** නිල්ගල, පර්යන්ත ප්‍රජාව, සාම්ප්‍රදායික දැනුම, සැවනා

## 1. හැඳින්වීම

වනාන්තරයෙන් ද්‍රව්‍ය රැස් කිරීම්, දඩයම් කිරීම, දඩයම් සොරකම් කිරීම සහ මසුන් ඇල්ලීම මානව පරිණාමයේ මුල් අවධිවල දී මානවයාගේ ප්‍රධාන යැපීම් මාධ්‍ය විය (Fairservis,1997). මීට වසර දෙලක්ෂ හැත්තෑ දහසකට පමණ පෙර නැගෙනහිර අප්‍රිකානු සැවානා ද සැවනා ද වචන දෙක ම මෙහි ඇත බිම්වල සිට ලෝකය පුරා ව්‍යාප්ත වූ නූතන මානවයා විසින් *(Homo-sapiens)* මේ පුරුදු ඔවුන්ට හමු වූ සහ ජනාවාස පිහිටුවා ගත් නව භූගෝලීය ප්‍රදේශවල ද බහුවිධ අනුවර්තනයන් සමග ක්‍රියාවට නංවන ලදී (Johanson,2001). විශේෂයෙන් ම නේවාසික කොට ගත් විවිධ වනාන්තර, තෘණබිම් සහ වෙරළ බඩ ප්‍රදේශ වැනි විවිධ පරිසර පද්ධති හා ඒවායේ ජීවත් වූ සත්ත්ව ගහණයන් සමග ද මේ බන්ධුතාව ගොඩනගා ගන්නා ලද බව පෙනේ (Chamberlain, 2016).

ශාක හා සත්ත්ව ගෘහස්ථකරණය, විශේෂයෙන් ම නව ශිලා යුගයේ දී (අදින් වසර 10000-15000 පමණ පෙර) කෘෂිකර්මය ආරම්භ වී ස්ථාවර ජනාවාස පිහිටු වූ පසුවත් වනාන්තර සමඟ දීර්ඝ කාලයක් තිස්සේ උපයෝගීතා ප්‍රවේශයක සිට ක්‍රියාවට නංවනමින් ආ දඩයම, ද්‍රව්‍ය රැස්කිරීම සහ මසුන් ඇල්ලීම හැර දමන්නට මිනිසා සමත් වූයේ නැත (Fairservis,1997). ඊනියා හරිත විප්ලවය, කාර්මීකරණය, පාරිභෝජනවාදයේ ආක්‍රමණය සහ ගෝලීයකරණය වැනි සංකීර්ණ සහ විපර්යකාරක කුණාටු තම මුල් බිම්, එනම් වනාන්තර සමඟ බැඳී නිසග මානව බන්ධුතා විස්ථාපනය කරන්නට සමත් ව නැති බව පැහැදිලි ය (Cashore et al.,2014). අධිපරිභෝජනය, ගෝලීයකරණය, අලෙවිකරණය සහ මාධ්‍ය විසින් ලෝකයේ ආහාර සංස්කෘතිය සමජාතිකකරණයට ලක් කරමින් තිබෙන සහ ප්‍රදේශීය ආහාර සංස්කෘතිවල තිබෙන අනන්‍යතාවන් හා සුවිශේෂීතාවන් දියකර හරිමින් තිබෙන අවදියක වුවත්, ලෝකයේ බොහෝ පර්යන්ත කලාපවල වනාන්තර තුළ සහ වනාන්තර පර්යන්තයේ ජීවත් වන ප්‍රජාව තම ඍජු සහ වක්‍ර යැපීම් අවශ්‍යතා සඳහා වනාන්තරවලින් රැස්කරගන්නා වනජ ද්‍රව්‍ය මත යැපේ (Oldekop et al.,2020).

සැවානා රුක්ෂලතාව ඉහළ විවිධත්වයකින් සහ ඵලදායීතාවකින් යුක්ත බව ලොව පුරා මේ පරිසර පද්ධති සම්බන්ධයෙන් කරන ලද අධ්‍යයනවලින් සනාථකරගෙන තිබේ (Madina,1980:Walker,1980 cited from හරස්ගම,1996ඃ පේමදාස,1999).

නූතන මානවයාගේ සම්භවය සහ අප්‍රිකානු සැවානා බිම් අතර ඍජු සම්බන්ධතාවක් තිබෙන අතර (Dominguez-Rodrgo,2014) ශ්‍රී ලංකාවේ කරන ලද සැවානා අධ්‍යයනවල දී සැවනා පරිසර පද්ධතිවල තිබෙන ඉහළ ඵලදායීතාව අනාවරණය කරගෙන ඇත (හරස්ගම,1996ඃ පේමදාස,1999). ශ්‍රී ලංකාවේ සැවනා පරිසර පද්ධති අතර 'ඌව උස්බිම්' ලෙස හඳුන්වන සැවනා වනාන්තර සුවිශේෂී වන්නේ ඒවා 'ඖෂධ වනාන්තර' ලෙස පරම්පරා ගණනාවක් තිස්සේ මිනිසුන්ගේ පිළිගැනීමට ලක් ව තිබෙන බැවිනි. එපමණක් නො ව මේ කලාපයේ වනාන්තර දිවයිනේ ආදිවාසීන් ලෙස පිළිගන්නා වැද්දන්ගේ නිජබිම් ලෙස ද දීර්ඝ කාලයක් තිස්සේ පැවත ඇත (Chandraratne,2016). නිල්ගල, බිබිල, මොනරාගල, ගල්ඔය ආශ්‍රිත කලාපයේ විසිරී ඇති මේ වනාන්තර විවිධ රාජ්‍ය ආයතන යටතේ පාලනයට යටත් කොට තිබෙන නමුත් ඒවායේ සංරක්ෂණ හා කළමනාකරණය තිබෙන්නේ ප්‍රශස්ත මට්ටමක නො වේ.

මේ පර්යේෂණයෙන් අපගේ අවධානයට ලක් වන්නේ ශ්‍රී ලංකාවේ සැවානා වෘක්ෂලතාව පර්යන්ත ප්‍රජාව, ඔවුන්ගේ වනාන්තර සමග බැඳි ජීවන ව්‍යවහාර, ඒවා වටා ගොඩනැඟී තිබෙන සාම්ප්‍රදායික දැනුම් පද්ධති සහ මේ සබඳතාවල නූතන වටිනාකම්, යෙදීම්වල විභවතාව සහ ප්‍රවණතා පිළිබඳව යි.

## 2. සාහිත්‍ය විමර්ශනය

### 2.1. පරිසර පද්ධති සේවා

පරිසර පද්ධති (Ecosystems) විසින් මිනිසාගේ යහපැවැත්ම වෙනුවෙන් සේවාවන් රාශියක් ඉටු කරනු ලබයි. මානව යහපැවැත්මට පරිසර පද්ධතියක ව්‍යුහය හා ක්‍රියාවලිය අනෙකුත් යෙදවුම් සමඟින් එක් ව දක්වන සහයෝගය නැති නම් දායකත්වය පරිසර පද්ධති සේවා (Ecosystem services) ලෙස නිර්වචනය කොට තිබෙන අතර Millennium Ecosystem Assessment (MEA) වාර්තාව (2005) විසින් මේ සේවා කාණ්ඩ හතරක් යටතේ ඉදිරිපත් කරනු ලැබ ඇත. එනම්ඃ

- සම්පාදන සේවා (Provisioning services)
- නියාමන සේවා (Regulation services)
- සංස්කෘතික සේවා (Cultural services)
- සහායක සේවා (Supporting services) වශයෙනි (Reid et al.,2007).

මෙම පර්යේෂණයේ දී අපගේ අවධානයට ලක් වන්නේ ස්වාභාවික වනාන්තර පරිසර පද්ධති අතරට ගැනෙන සැවානා පරිසර පද්ධති ය. සැවනා වනාන්තරයක් යනු ඉහළ කාර්යක්ෂමතාවක් සහ ඵලදායිතාවකින් යුතු පරිසර පද්ධතියක් වන අතර එය ඉහතින් දක්වා තිබෙන බොහෝ පරිසර පද්ධති සේවාවන් ඉටු කරයි. තවමත් ලෝකයේ වනාන්තර තුළ සහ වනාන්තර පර්යන්තයේ ජීවත්වෙන ප්‍රජාව ආහාර, නිවාස සපයා ගැනීමේ දී පරිසර පද්ධති සේවාවන් ඍජු ව භුක්ති විඳින අතර ලොව සැම ප්‍රදේශයක ම ප්‍රජාව ඍජු ව සහ වක්‍ර ව වනාන්තර මගින් සැලසෙන සේවාවල පහසුව ලබා ගනී.

දැව නොවන වනජ යනු ප්‍රධානතම පරිසර පද්ධති සම්පාදන සේවාවක් (Provisioning service) වන අතර යම් ප්‍රජාවකගේ පැවැත්මට එය තීරණාත්මක බලපෑමක් ඇති කරයි. අප මෙහි දී සාකච්ඡාවට පදනම් කරගන්නේ පරිසර පද්ධති සේවාවක් ලෙස වනජ ද්‍රව්‍ය සම්පාදනය සම්බන්ධයෙන් සැවනා වෘක්ෂලතාව දක්වන දායකත්වය පිළිබඳ ව යි. එය හුදු යැපීමක් පමණක් නො ව පුළුල් සංස්කෘතික වපසරියක් ස්පර්ශ කරන සහ වනාන්තර සංරක්ෂණය සහ කළමනාකරණය සම්බන්ධයෙන් නූතන එළඹුමක් වන ප්‍රජාවන් සමග වගකීම් සහ ප්‍රතිලාභ බෙදා ගන්නා ප්‍රවේශයකට මග කියන බව ද හඳුනාගත හැකි ය.

## 2.2. ශ්‍රී ලංකාවේ වනාන්තර සහ මිනිස්සු

ජෛව විවිධත්වයෙන් උණුසුම් නිවර්තන කලාපීය දූපතක් වන ශ්‍රී ලංකාව අයත් වන භූ ස්කන්ධයේ උපත සහ විකාශනය අනාවරණය කර ගැනීම සඳහා භූ ඉතිහාසයේ අදින් වසර මිලියන 144කටත් 65කටත් පෙර පැවති ක්‍රෙටේසියස් යුගයේ ඇති වූ භූ විපර්යාස වැදගත් වේ. ගොන්ඩ්වානාලන්තයට අයත් ව තිබී පසු ව ඉන් බෙදී සමකය දෙසට ප්ලවනය වූ ඩෙකෑන් තැටියට අයත් ව ශ්‍රී ලංකාව පිහිටියේ ය (මනමේන්ද්‍ර-ආරච්චි සහ පෙතියාගොඩ,2006). වසර දහස් ගණනක මේ භූ විද්‍යාත්මක ක්‍රියාවලිය සහ දේශගුණික

තත්ත්වයන්ගේ සිදු වූ වෙනස්කම් දිවයිනේ ජෛව විවිධත්වය වැඩි කරන්නට හේතු වී ඇත.

ශ්‍රී ලංකාවේ විවිධ නිවර්තන වෘක්ෂලතා කලාප සහ ඒවා නිවහන කරගත් සත්ත්ව සහ ශාක ප්‍රජාව මෙම වනාන්තරවල ඉපැරණි බවට ජීවමාන සාක්ෂි සපයයි. අවසාන වසර 31000 තුළ මේ වර්ෂා වනාන්තර ආශ්‍රිත ව උෂ්ණත්වය සෙල්සියස් අංශක පහකින් වත් වෙනස් ව නැති බව තෙත් කලාපයේ ගල් ගුහා ආශ්‍රිත ව කරන ලද ප්‍රාග් ඓතිහාසික කැණීම්වලින් සනාථ කරගෙන ඇත (දැරණියගල,2003). මේ පුරාණ පරිසර විද්‍යාත්මක ගොඩනැගීම් සිදු කොට ඇත්තේ කුරුවිට බටදොඹලෙන ප්‍රාග් ඓතිහාසික තැන්පතු අතුරෙන් හමු වන අකාවස් (Acavus sp) ගණයට අයත් ගස් ගොළුබෙල්ලන් සහ වල් දෙල් *(Artocarpus nobilis)* ඇට අනුසාරයෙනි (දැරණියගල,2003). පශ්චාත් කාලීන ව කරන ලද තවත් අධ්‍යයන මගින් අනාවරණය වී ඇත්තේ නිවර්තන වැසි වනාන්තර පරිසරයේ ජීවත් වන සතුන් සහ ශාක අදින් වසර පනස් දහසකට පමණ පෙර සිට ම පැවත ඇති බව යි (මනමේන්ද්‍ර-ආරච්චි,2003). එමෙන් ම පහත රට තෙත් කලාපයේ ලෙන් ආශ්‍රිත ව ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික මානවයා මේ වනාන්තරවලින් ලබාගත් ශාකමය ආහාර පරිභෝජනය කර තිබෙන බව ද සනාථ වී ඇති. කැණීම්වලින් පිළිස්සුණු කැකුණ *(Canarium zeylanicum)* ඇට ලැබී ඇති අතර අදින් වසර තිස්පන් දහසකට පෙර සිට ම කැකුණ ඇට ආහාර ලෙස ලබා ගෙන ඇත. ඒවා සකස් කර ගැනීම සඳහා මෙවලම් ද තනා ගෙන ඇති බවට පුරාවිද්‍යාඥයෝ සනාථ කර සිටිති. අදින් වසර 16000කට අධික කාලයක සිට වල් දෙල් උණු අළු පල්ලේ දමා පුළුස්සා ආහාරයට ගත් බවට සාධක ලැබී ඇත. එමෙන් ම එම ගල් ලෙන්වල අවුල් පස් තට්ටුවලින් ඇටිකෙසෙල් *(Musa balbisiana)* ඇට හඳුනා ගෙන ඇත (දැරණියගල, 2003). මීට අමතර ව වැසි වනාන්තර ආශ්‍රිත ව තිබෙන ශාක විශේෂ සහ ඒවායේ විවිධ කොටස් ප්‍රාග් ඓතිහාසික මිනිසා මෙන් ම ඊට පසු කාලීන ව ද වර්තමානය දක්වා ම ද වනාන්තර තුළ සහ පර්යන්තයේ ජීවත වන මිනිසුන් විසින් පරිභෝජනය කරනු ලබයි.

### 2.3. ශ්‍රී ලංකාවේ සැවානා වෘක්ෂලතාව

ශ්‍රී ලංකාවේ පුරෝගාමී වෘක්ෂලතා අධ්‍යයනවල දී සැවානා වෘක්ෂලතාව සුවිශේෂී වැදගත්කමකින් යුතු වෘක්ෂලතා කලාපයක් ලෙස හඳුනාගෙන තිබේ (හරස්ගම,1996). සැවානා හෝ සවානා (Savana) යන්න ශ්‍රී ලංකාවේ වෘක්ෂලතා අධ්‍යයනවල දී පළමු

වරට යොදා ගනු ලැබුවේ ඌවේ විසිරුණු ගස් සහිත තණබිම් හඳුනා ගැනීම සඳහා එල්සි කුක් විසිනි (Cook,1931). මීට අමතර ව Champian,1936;Chapman, 1947;Holmes, 1951; Koelmeyer, 1957; Andrews, 1961; Gaussen et al., 1968; Perera, 1968; හරස්ගම,1989; පේමදාස,1999 අය ශ්‍රී ලංකාවේ සැවානා වෘක්ෂලතාව පිළිබඳ ව අධ්‍යයනය කර, එහි නිර්මාණය, සංයුතිය, විවිධත්වය සහ ක්‍රියාවලිය පිළිබඳ ව විස්තර කොට ඇත. ශ්‍රී ලංකාවේ පුරෝගාමී සැවානා අධ්‍යයන පිළිබඳ ව විමසමින් වඩා විස්තරාත්මක නිර්වචනයක් ඉදිරිපත් කරන හරස්ගම (1989) "සවානා වූ කලී රූප විද්‍යාව හා ශාක සංයුතිය අනුව ප්‍රමුඛ ස්තරයේ ඛණ්ඩිත වන වියනක් සහිත වූ, කාෂ්ඨීය ගස් සහ පඳුරු විශේෂ තනි තනි ව හෝ ගස් රොද වශයෙන් පවතින්නා වූ, බිම් ස්තරයෙහි සෞරකාමී තෘණ සහ පැළෑටි විශේෂවලින් ගැවසී ගත්නා වූ ද, ශුෂ්ක රූපී ලක්ෂණ පිළිබිඹු කරන්නා වූ ද, විශේෂයෙන් ම නිවර්තන වර්ෂා වනාන්තර සහ තණබිම්වලට වඩා වෙනස් වූ  බොහෝ දුරට උද්‍යාන ලක්ෂණ පිළිබිඹු කරන්නා වූ සුවිශේෂී ශාක ප්‍රජාවකි" වශයෙන් හඳුන්වා දී ඇත. මෙම නිර්වචනය මෙන් ම, පූර්ව සැවනා අධ්‍යයනවලින් අනාවරණය  වන්නේ මෙම වෘක්ෂලතා ප්‍රජාව සෙසු වෘක්ෂලතාවන්ට වඩා සුවිශේෂී ගති ලක්ෂණ දරන බව යි. විශේෂයෙන් ම මෙහි ශාක සංයුතිය, ක්‍රියාවලිය සහ උද්‍යාන ලක්ෂණ ඒ අතර ප්‍රමුඛ වේ.

ශ්‍රී ලංකාවේ වෘක්ෂලතා වර්ගීකරණය පිළිබඳ ව වඩා පුළුල්, තාර්කික සහ විස්තරාත්මක වර්ගීකරණයක් ඉදිරිපත් කරන පේමදාස (1999) ශ්‍රී ලංකාවේ තණබිම් කාණ්ඩ තුනක් යටතේ වර්ගීකරණය කරයි. එනම්,

- කඳුකර තණබිම් (Montane grasslands)
- සවානා තණබිම් (Savana grasslands)
- පහත රට තණබිම් (Lowland grasslands) යනුවෙනි.

"සිරිලකේ සවානා වශයෙන් සැලකෙන්නේ ප්‍රමුඛතම තුරු  සාමාජික කණ්ඩායමක් ද දරා ගත් තෘණ බිම් සම්පතයි. කඳුකර පතන බිම්වල මෙන්ම පහතරට තෘණ බිම්වල හුදෙකලාතුරු දක්නට ලැබෙතුදු සවානාවන්ගේ තුරු සාමාජිකයෝ ඒ දෙකේම සාමාජිකයන්ට වඩා ප්‍රමුඛතමයෝ වෙති.  කඳුකර හා පහතරට තෘණ බිම්වල තුරු දක්නට ලැබෙන්නේ අනිවාර්යාංගයක් වශයෙන් නොවේ. සවානා බිම්වල තුරු සාමාජිකයෝ තෘණ කලාලය මෙන්ම පාරිසරික වැදගත්තමයෝ වෙති" (පේමදාස,1999:167).

ඔහු සදහන් කරන පරිදි ම සැවනාවට උද්‍යාන ලක්ෂණ එක් කරන්නේ මේ තුරු සාමාජිකයන් නැතහොත් කාෂ්ඨීය ශාක යි. අරළු, බුළු, නෙල්ලි, ගම්මාළු, කහට ආදිය සැවානාවේ ප්‍රමුඛ කාශ්ඨීය ශාකයෝ වෙති.

තව දුරටත් ඔහු සඳහන් කරන්නේ සවානා වෘක්ෂලතාව පාරිසරික වශයෙන් මෙන් ම සමාජීය, සංස්කෘතික, ආර්ථික, අධ්‍යාපනික හා විද්‍යාත්මක පමණක් නො ව ඓතිහාසික වශයෙන් ද වැදගත් වන නමුත්, පර්යේෂකයන්ගේ, නිලධාරින්ගේ සහ වෙනත් වගකිවයුත්තන්ගේ නිසි අවධානයක් මේ වන තෙක් මේ සැවනා පරිසර පද්ධතිවලට ලැබී නොමැති බව යි (පේමදාස,1999:144). මෙහි ප්‍රතිඵලයක් ලෙස බොහෝ සංවර්ධන ව්‍යාපෘතිවල දී පළමු ව මානව බලපෑමට ලක් වන වෘක්ෂලතා කලාපයක් ලෙස සැවනා වෘක්ෂලතාව හඳුනාගත හැකි ය.

ප්‍රේමදාසට අනුව (1999) උස්බිම් (Upland) සවානා සහ පහත් බිම් (Lowland) සවානා අවකාශීය ව්‍යාප්තිය අනුව හඳුනා ගෙන තිබේ. ඒවායේ සංරක්ෂණ අවශ්‍යතාව, තර්ජන හා පරිසර පද්ධති සේවා සැලසීම අර්ථයෙන් තිබෙන වැදගත්කම කෙරෙහි මෑත කාලීන පර්යේෂකයන්ගේ ද අවධානය යොමු ව තිබේ (MOMD and E, 2019:99-100).

2.4. නිල්ගල සැවනා වෘක්ෂලතාව සහ ප්‍රජාව

රූප විද්‍යාව සහ අවකාශීය පැතිරීම අනුව නිල්ගල සැවානා වෘක්ෂලතාවේ ව්‍යාප්තිය පොදුවේ උස් බිම් සහ පහත් බිම් සැවානා යන වර්ගීකරණ ද්විත්වයේ ම ලක්ෂණවල මිශ්‍රණයක් ලෙස හඳුනාගත හැකි ය. නිල්ගල ආශ්‍රිත ව මෑතක කරන ලද සත්ත්ව විද්‍යාත්මක අධ්‍යයන කීපයක් මගින් දිවාසැරි හූනන් (Day geckos), හිකනලුන් (Skinks), මැඩියන් (Frogs) ඇතුළු උරග හා උභය ජීවී විශේෂ ගණනාවක් වාර්තා කොට තිබේ (Goonewardene et al.,2003; Karunarathna et al.,2006; 2007; 2008;2012;2013;2019). එම පර්යේෂණවලින් පෙනී යන්නේ ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්ව සංරක්ෂණය සම්බන්ධයෙන් ද විශේෂවලට (Species) නේවාසික සැපයීමේ (Provide habitats) අර්ථයෙන් ද මෙම සැවානා වෘක්ෂලතාවට සුවිශේෂී වැදගත්කමක් හිමි වන බව යි.

නිල්ගල වනාන්තරය ඈත අතීතයේ සිට ම ඖෂධ වනාන්තරයක් ලෙස පිළිගෙන තිබෙන අතර සාහිත්‍ය මූලාශ්‍රයවල මෙන් ම ජනප්‍රවාදවල ද මෙම වනාන්තරයේ ඖෂධීය

වටිනාකම පිළිබඳ ව කරුණු සඳහන් වේ (කරුණාරත්න,2014). මෙය සුවිශේෂී කියවීමක් වන අතර ශ්‍රී ලංකාවේ වෙනත් කිසිදු වනාන්තරයකට නොලැබෙන වටිනාකමක් ඖෂධ භාවිතය සම්බන්ධයෙන් මේ වනාන්තරයට ආරෝපණය වීම අවධානය යොමු කළ) යුතු කාරණයකි. නිල්ගල වනාන්තර පර්යන්තයේ ජීවත් වන ප්‍රජාව පාරම්පරික ව, තම සාම්ප්‍රදායික ජීවන ව්‍යවහාරයක් ලෙස වනාන්තරයෙන් වනජ ද්‍රව්‍ය රැස්කිරීම, විශේෂයෙන් ම ඖෂධ වර්ග රැස් කිරීම සිදු කර තිබේ (කරුණාරත්න,2014). මේ වන තෙක් ම, ඒවා අලෙවිය ඔවුන්ගේ ප්‍රධාන ම යැපීම් මාධ්‍යයක් වන අතර ම එම දැව නොවන වනජ (Non-timber forest products) ඔවුන්ගේ දෛනික යැපීම සඳහා ද යොදා ගනියි. මෑත කාලීන ව මෙම උපයෝජන රටාවල සිදු වී ඇති වෙනස්කම් අප තේරුම් ගත යුත්තේ සහකාලීන සමාජීය, ආර්ථික සහ දේශපාලනික ගතිකයන්වල ප්‍රතිඵලයක් ලෙසිනි. මෙම වනාන්තරවල තිබෙන ජෛව විවිධත්වය ජෛව කොල්ලය (Bio-piracy) සහ නීති විරෝධී වනජීවී වෙළඳාමට (Illegal wildlife trade) ගොදුරු වීමේ අවදානම ද අප සැලකිය යුත්තේ මේ ක්‍රියාවලියේ ම දිගුවක් ලෙසිනි (Kumara et al.,2017)

වනාන්තරය ගිනි තැබීම, අනවසර අල්ලා ගැනීම සහ එළිකිරීම, ගවගාල් ස්ථාපිත කිරීම සහ හීලෑ ගවයන් වනාන්තරයට ඇතුළු කිරීම, දඩයම් කිරීම වැනි තර්ජනයන් නිල්ගල වනාන්තරයේ පැවැත්මට බාධා කරමින් තිබේ (Friends of the Earth International,2014;Environmental Justice allas,2015). එපමණක් නො ව, අවිධිමත් සහ වගකීම් විරහිත සංචාරක ක්‍රියාකාරකම් එළඹුම්, වනාන්තරයට පමණක් නො ව වනාන්තර පර්යන්තයේ සාම්ප්‍රදායික ජීවන ව්‍යවහාර සහ හර පද්ධති) තීරණාත්මක ලෙස විස්ථාපනය කරමින් තිබේ (කරුණාරත්න,2014).

මේ තර්ජන වළක්වා ගැනීම සඳහා ප්‍රජාව පාදක කරගත් වන සංරක්ෂණ සහ කළමනාකරණ ප්‍රවේශයක් තැනීමට නිර්මාණශීලී මෙන් ම, ඵලදායී ප්‍රජා සංරක්ෂණ ක්‍රමවේදවල විභවතාවක් පවතින බව හඳුනා ගෙන තිබේ (කරුණාරත්න,2014;Friends of the Earth International,2014). නෛතික ප්‍රතිපාදන මගින් ළඟා විය නොහැකි සහ දුෂ්කර ඇතැම් වන සංරක්ෂණ හා කළමනාකරණ ගමනාන්ත මෙවැනි එළඹුම් හරහා සාධනය කර ගැනීමට තිබෙන ශක්‍යතාව මෙම පර්යේෂණවලින් හඳුනා ගෙන ඇත.

### 3. පර්යේෂණ ගැටලුව

සැවනා වෘක්ෂලතාව ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වයෙන් පොහොසත් ස්වාභාවික වනාන්තර කලාපයක් ලෙස හඳුනා ගෙන ඇති අතර එය පුළුල් "වනාන්තර නිෂ්පාදන සහ සේවා" සැපයීම සඳහා දායකත්වය සපයයි. මෙම වනාන්තර පර්යන්තයේ ජීවත් වන ප්‍රජාව පරම්පරා ගණනාවක් තිස්සේ තම සාම්ප්‍රදායික දැනුම පදනම් කර ගෙන මේ වනාන්තර තිරසර ලෙස උපයෝජනයේ යෙදී තිබේ. එසේ වුවත් පසු කාලීන ව හඳුන්වා දුන් "වන සංරක්ෂණ සහ වනජීවී සංරක්ෂණ" වැඩසටහන් සහ උපායමාර්ගවල දී පර්යන්ත ප්‍රජාව, ඔවුන්ගේ ජීවන ව්‍යවහාර මෙන් ම ඔවුන් සතු සාම්ප්‍රදායික දැනුම් පද්ධති ද නො සලකා හැර ඇති අතර මෙනිසා සැවනා වනාන්තර සහ එහි ජෛව-අජෛව සංරචක (Biotic and Abiotic components) සංරක්ෂණය සහ කළමනාකරණය අභියෝගයක් ව තිබෙන අතර පර්යන්ත ප්‍රජාවන්ගේ පැවති තිරසර වනගත ජීවන ව්‍යවහාරවල ස්වභාවය සහ යැපීම් විධි පූර්ණ වෙනසකට ලක් ව තිබේ. මෙනිසා මේ පර්යේෂණයේ පර්යේෂණ ගැටලුව වන්නේ සැවනා වනාන්තර සංරක්ෂණය සහ කළමනාකරණය සඳහා සාම්ප්‍රදායික දැනුම පදනම් කරගත් වනගත ජීවන ව්‍යවහාරවල ඵලදායීතාව නැවත සලකා බැලිය යුත්තේ ඇයි? යන්න විමසීම යි.

### 4. පර්යේෂණ ප්‍රශ්න

- ජෛව විවිධත්වයෙන් පොහොසත් සැවානා වනාන්තර වටා ජීවත් වන ප්‍රජාවන්ගේ ජීවන ව්‍යවහාර පෝෂණයෙහි ලා සැවානා වෘක්ෂලතාවේ දායකත්වය කුමක් ද?
- පරිසර පද්ධති සේවා වශයෙන් සැවනාවෙන් ලබාගන්නා වනජ ද්‍රව්‍යවල විවිධත්වය සහ ඒවායේ ඇති වැදගත්කම කුමක් ද?
- වනජ ද්‍රව්‍ය රැස්කිරීම සහ සාම්ප්‍රදායික දැනුම් පද්ධති අතර තිබෙන අවියෝජනීය සම්බන්ධතාව කුමක් ද?
- වනජීවී, වන සංරක්ෂණ උපාය මාර්ග වනගත ජීවන ව්‍යවහාරවලට බලපෑම් කරන්නේ කෙසේ ද?
- වනජීවී, වන සංරක්ෂණ ක්‍රියාවලියේ දී ප්‍රජාව සම්බන්ධ කරගන්නා ප්‍රවේශයක් ලෙස සාම්ප්‍රදායික වනගත ජීවන ව්‍යවහාරවල උපයෝගීතාව සහ විභවතාව කුමක් ද?

## 5. පර්යේෂණ අරමුණු

සැවානා වෘක්ෂලතාව පර්යන්ත ප්‍රජාව, වනජ ද්‍රව්‍ය රැස්කිරීමේ සිය ජීවන ව්‍යවහාර හරහා වනාන්තරය සමග ගොඩනගා ගෙන තිබෙන දීර්ඝකාලීන සම්බන්ධතාව වඩා දියුණු සංස්කෘතික වපසරියක් ස්පර්ශ කරයි. මේ අධ්‍යයනයේ පර්යේෂණ අරමුණු ඉහත පුළුල් අවකාශය ආවරණය කිරීමට උත්සාහ කරයි.

5.1. ප්‍රධාන අරමුණ

- ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වයෙන් පොහොසත් සැවානා වනාන්තර පද්ධති වටා ජීවත් වන පර්යන්ත ප්‍රජාවන්ගේ ජීවන ව්‍යවහාර පෝෂණයෙහි ලා සැවානා වෘක්ෂලතාවේ දායකත්වය හඳුනා ගැනීම.

5.2. උප ප්‍රධාන අරමුණු

- පරිසර පද්ධති සේවා වශයෙන් සැවනාවෙන් ලබාගන්නා වනජ ද්‍රව්‍යවල විවිධත්වය සහ ඒවායේ ඇති වැදගත්කම හඳුනා ගැනීම
- වනජ ද්‍රව්‍ය රැස්කිරීම සහ සාම්ප්‍රදායික දැනුම් පද්ධති අතර තිබෙන අවියෝජනීය සම්බන්ධතාව අනාවරණය කර ගැනීම
- වනජීවී, වන සංරක්ෂණ උපාය මාර්ග වනගත ජීවන ව්‍යවහාරවලට කරන බලපෑම හඳුනා ගැනීම
- වනජීවී, වන සංරක්ෂණ ක්‍රියාවලියේ දී ප්‍රජාව සම්බන්ධ කරගන්නා ප්‍රවේශයක් ලෙස සාම්ප්‍රදායික වනගත ජීවන ව්‍යවහාරවලට උපයෝගීතාව සහ විභවතාව හඳුනා ගැනීම.

## 6. පර්යේෂණ ක්‍රමවේදය

සාම්ප්‍රදායික දැනුම් පද්ධති සහ වනජ ද්‍රව්‍ය රැස්කිරීම අතර තිබෙන සබඳතාව කුමක් ද? යන්න සහ නූතන වන සංරක්ෂණ උපාය මාර්ග පර්යන්ත ප්‍රජාවන්ගේ සාම්ප්‍රදායික වනගත ජීවන ව්‍යවහාරවලට ඇතිකර තිබෙන බලපෑම කුමක් ද? යන්න අනාවරණය කර ගැනීම මෙම පර්යේෂණයේ ප්‍රධානතම අරමුණ වෙයි. නෛතික ව යම් සීමාකම්

පනවා තිබෙන නමුත්, සැවානා වනාන්තර පර්යන්ත ප්‍රජාව තම යැපීම් මූලාශ්‍රයක් ලෙස වනාන්තරය තව දුරටත් යොදා ගන්නේ ඇයි? සහ මෙම යෙදීම් තිරසර වන සංරක්ෂණ සහ පරිසර පද්ධති සේවා පවත්වා ගෙන යාමේ ප්‍රවේශයක් නිර්මාණය කරන්නට මූලාශ්‍රය කරගත හැකි ද? යන්න අපගේ පර්යේෂණ ප්‍රශ්න වෙයි. ඉහත ප්‍රශ්නවලට පිළිතුරු සොයා ගැනීම සඳහා මෙම අධ්‍යයනය ගුණාත්මක ක්‍රමවේදය (Qualitative methodology) අනුව සැලසුම් කරන ඇත. නිල්ගල සැවානා වෘක්ෂලතා කලාපය නියෝජනය වන පරිදි ගම්මාන ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා තෝරා ගෙන ඇත. මන්ද මේ ගම්මානවල ප්‍රජාව නිල්ගල වනාන්තරයෙන් වනජ ද්‍රව්‍ය රැස් කිරීමේ ජීවන ව්‍යවහාරය තවමත් ජීවමාන ව කරන බැවිනි. නිල්ගල වනාන්තරයෙන් වනජ ද්‍රව්‍ය රැස්කරන පුද්ගලයන් සහ ඒවා උපයෝජනය සඳහා සකස් කරන ස්ත්‍රී - පුරුෂ දෙපාර්ශ්වය ම අරමුණු ගත නියැදි ක්‍රමය (Purposive Sampling method) අනුගමනය කරමින් අර්ධ ව්‍යූහගත සම්මුඛ සාකච්ඡා (Semi-Stractuered Interviews) සඳහා තෝරා ගන්නා ලද අතර ඒ හරහා දත්ත සහ තොරතුරු රැස් කර ගන්නා ලදී. කරාඩුගල ග්‍රාම නිලධාරී වසමින් සම්මුඛ සාකච්ඡා හයක් (06) ද නිල්ගල ග්‍රාම නිලධාරී වසමෙන් සම්මුඛ සාකච්ඡා හතක් (07) ද සිදුකරන ලද අතර නිරීක්ෂණය ද දත්ත රැස් කිරීමේ විධි ක්‍රමයක් ලෙස භාවිත කරන ලදී. දත්ත විශ්ලේෂණය සඳහා ආඛ්‍යාන විශ්ලේෂණය ක්‍රමය (Narrative analysis) උපයෝගී කොට ගෙන තිබෙන අතර ඒ අනුව පුද්ගල ආඛ්‍යානයන් උප මාතෘකා යටතේ සංවිධානය කරමින් ඒවායෙන් විශද වන අර්ථයන් කතිකාව සඳහා ගොනු කොට ඇත. දත්ත ඉදිරිපත් කිරීමේ දී විස්තරාත්මක රචනා ක්‍රමය (Descriptive writing) ඍජු උපුටා දැක්වීමේ ක්‍රමය (Direct Quotations) හා ගැලීම් සටහන් (Flow diagrams) උපයෝගී කර ගෙන ඇත.

**7. අධ්‍යයන ප්‍රදේශය**

නිල්ගල වනාන්තරය නැගෙනහිර පළාතේ අම්පාර හා ඌව පළාතේ මොනරාගල දිස්ත්‍රික්කයන්ට අයත් වේ. සමස්තයක් ලෙස ගත් කල නිල්ගල වනාන්තරය, මඩුල්ල, මැදගම, බිබිල, ඉගිනියාගල, අම්පාර යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස යටතට ගැනේ.

නිල්ගල වනාන්තරය වන හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු යන ආයතන දෙකට ම අයත් වන වනාන්තර කලාපයකි. වනාන්තරයේ නැගෙනහිර කොටස වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වේ. එම ප්‍රමාණය හෙක්ටයාර් නවදහසක් (9000)

පමණ ය (Wilson et al.,2022). ගල්ඔය ජතික උද්‍යානයට අයත් වන්නේ මේ භූමිය යි. වැඩි කොටස එනම් හෙක්ටයාර් 13000ක් පමණ පාලනය කරන්නේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යි (Karunarathna,2008;2012). මේ අනුව පැතිරුණු සැවානා බිම් ද සමග බිබිල-නිල්ගල වනාන්තරය හෙක්ටයාර් 26000ක් පමණ පුරා පැතිර පවතී.

ඌව පලාතේ මොනරාගල දිස්ත්‍රික්කයේ බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් නිල්ගල වනාන්තර පර්යන්තයේ පිහිටි නිල්ගල සහ කරාඩුගල ග්‍රාම නිලධාරී වසම් මෙම අධ්‍යයනය සඳහා පාදක කර ගත් අතර මේ වසම්වලට අයත් ගම්මාන වූයේ මල්දම්අබේ, හතේ කණුව, වැද්දාබැදිහින්න, සේරව, කරාඩුගල සහ හැකොලන්දෙනිය යි.  ගම්මාන තෝරා ගනු ලැබුවේ නියමු ක්ෂේත්‍ර නිරීක්ෂණයකට පසුව පර්යන්ත ප්‍රජාව වනාන්තරය සමග තිබූ සබඳතාවේ ස්වභාවය සැලකීමෙනි.

**8. ප්‍රතිඵල සහ විශ්ලේෂණය**

සැවානා වනාන්තර පරිසර පද්ධතිය සමග පර්යන්ත ප්‍රජාව ගොඩනගා ගෙන තිබෙන සබඳතාව ප්‍රධාන ක්ෂේත්‍ර කීපයක් ඔස්සේ හඳුනා ගත හැකි ය. එය හුදු උපයෝගිතාව පදනම් කරගත්තක් පමණක් නොවන අතර සංකීර්ණ උප සංස්කෘතික වපසරියක් ද නියෝජනය කරයි.

8.1. වන වැදීම

ගැමියන් වනාන්තර ගත වීම වසර පුරාම සිදු වේ. දෛනික දර අවශ්‍යතාව සපුරා ගැනීමේ සිට පරිභෝජනය සඳහා සහ අලෙවිය සඳහා වනජ ද්‍රව්‍ය රැස්කිරීමේ පරාසයක් දක්වා එය පැතිර තිබේ.

> "උදේට ගිහින් හවසට එන කණ්ඩායම් වෙනම හිටියා නෙල්ලි වගේ දේවල් හුග දෙනෙක් එකතු කලේ එහෙම. 2000 ට පස්සේ  විතර තමයි මේ වෙනස ඇතිවුණේ.  මේවට වැඩි ඉල්ලුමක් ආවා. පස්සේ ටිකක් ඈතට යන්න පටන් ගත්තා. එක දවසක් රෑ කැලේ නතර වෙලා දේවල් එකතු කරන්න පටන් ගත්තා".

එමෙන් ම විවිධ කණ්ඩායම්, වනාන්තරයේ ගත කරන කාලය ඔවුන්ගේ අවශ්‍යතාව සහ වනාන්තරය ගැන තිබෙන දැනුම සහ අවබෝධය අනුව තීරණය වේ. වනාන්තරය ගැන

වැඩි දැනුමක් සහ අද්දැකීම් තිබෙන පුද්ගලයන් වනාන්තරයේ දුර සහ දුෂ්කර ප්‍රදේශවලට ප්‍රවේශ වන අතර සෙසු පිරිස් ඒ ප්‍රදේශවලට පිවිසීම අවම ය.

8.2. වනජ ද්‍රව්‍ය රැස්කිරීම

සාම්ප්‍රදායික වනගත ජීවන ව්‍යවහාර සියල්ල ගොනු වී තිබෙන්නේ වනජ ද්‍රව්‍ය රැස්කිරීම වටා ය. එය සැලකිය හැක්කේ දීර්ඝ කාලයක් තිස්සේ නිල්ගල වනාන්තරය වටා ගොඩනැගුණු උප සංස්කෘතික ලක්ෂණයක් වශයෙනි.

8.2.1. බීඩි කොළ කැඩීම

> "බීඩි කොළ අද කඩලා හෙට අව්වට දාන්න ඕනේ. දවසකට කිලෝ තුන හතරක් කඩන්න පුළුවන්. කිලෝ එකක් රුපියල් 1500 ක් වගේ වෙනවා. ගින්න ගියාම තමයි හොඳට කුඩුම්බේරිය පඳුරු දාලා හැදෙන්නෙ. දැන් ගිනි යන්නෙ නැති නිසා පඳුරු නෑ, ගෙඩි තියෙන පඳුරක් කැලේ හොයා ගන්නත් අමාරුයි. බීඩි කොළ කැලේ නැතිම කාලයක් නෑ. වැස්ස කාලෙට තමයි අඩු. මේවයේ නෙරි අස්වැන්නකුත් තියෙනවා".

බීඩි කොළ කැඩීම සහ අලෙවිය සඳහා සකස් කිරීමේ කාර්ය වෙනුවෙන් වැඩි කාන්තා සහභාගිත්වයක් දක්නට ලැබේ. බීඩි කොළ පදම් කිරීමේ කාර්යය කාන්තාවන් වෙත පවරන ලද නිසා ම ඒ හා සම්බන්ධ දැනුම ද ඔවුන් වෙත කේන්ද්‍ර ගත වී තිබේ.

වනාන්තරයෙන් රැස් කර ගන්නා කුඩුම්බේරිය කොළ දින දෙකක් පමණ මඳ අව්වේ තුනි (කර වේලා) ගනී. වඩාත් හොඳ ක්‍රමය වන්නේ ගොම ගෙබිමක් මත දමා වියළා ගැනීම යි. පවතින කාලගුණය අනුව වතුර ඉසිමින් සහ රාත්‍රියට පින්න වැදීමට එළියේ දැමීම මගින් මෙම පත්‍ර පදම් කර මිටි බැඳීමට අවශ්‍ය පරිදි සකස් කර ගනී. මෙය පදම් කර ගැනීමේ ක්‍රියාවලියක් ලෙස ද හැඳින්විය හැකි ය.

> "ගින්දර වැදුණට පස්සේ ගැහැනු අය බීඩි කොළ කඩන්න කැලේ යන්නේ හය හත් දෙනා එකතු වෙලා. මොකද එතකොට කැලේ තණකොළ පිච්චිලා ඇත පේනවා. අලි එහෙම හිටියොත් පේන නිසා බයක් නෑ. වැස්ස වැටුනට පස්සේ ගැහැණු අය කැලේ යනවා අඩුයි. ගහෙන් ගහට පේන්නෙ නෑනේ. බුලුපිටිය ගමේ ගැහැනු දෙන්නෙක් මැරුණ අලි ගහලා බීඩි කොළ කඩන්න ගිහින්".

බීඩි කොළ කැඩීම සඳහා වනාන්තර ගත වීම අවදානම් කාර්යයක් බව පැහැදිලි ය. මෑතක වන අලි පහරදීමවලින් මියගිය කාන්තාවන් එම ප්‍රහාරවලට ගොදුරු වී ඇත්තේ බීඩි කොළ කැඩීම සඳහා වන ගත වූ අවස්ථාවල දී ය.

8.2.2. ත්‍රිපලා - අරළු, බුළු සහ නෙල්ලි

නිල්ගල වනාන්තරය වඩා ප්‍රසිද්ධියක් උසුලන්නේ ඖෂධ සම්බන්ධයෙන් වුවත් එහි වැඩි අවධානයක් යොමු ව තිබෙන්නේ අරළු, බුළු, නෙල්ලි යන විශේෂ ත්‍රිත්වයට යි. නිල්ගල වනාන්තර පර්යන්ත ප්‍රජාවගේ වනජ රැස්කිරීම්වලින් මේ විශේෂ රැස්කිරීම දෙවෙනි හෝ සමතැන ගන්නේ බීඩි කොළ කැඩීමට පමණි.

> "පැරණි අය කැලේ පාවිච්චි කළේ කැලේට ආදරෙන් කැලේ පැවැත්ම බලාගෙන. නෙල්ලි කැඩුවා. අහුලනවා. ඕනතරම් තිබුණා. ඊට පස්සෙ ගිය පරම්පරාවෙ අය ක්ෂණිකව සල්ලි හොයන්න පටන් ගත්තා. ගහේ නගින්න බැරි නිසා ගස් කපන තත්වෙට පත්වුණා".

පරම්පරා අතර වනජ ද්‍රව්‍ය රැස්කිරීම සම්බන්ධයෙන් පවතින පරස්පරතා හඳුනා ගත හැකි ය. වයස අවුරුදු 60ට වැඩි බොහෝ පිරිස් ඔවුන්ගේ දරු මුනුපුරන් වනජ ද්‍රව්‍ය රැස්කිරීම සහ දඩයම විනාශකාරී ලෙස සිදු කරන බවට චෝදනා කරති. මෙම චෝදනාවට අදාළ හැසිරීම බාහිර සාධක රාශියක ප්‍රතිඵලයක් බව පෙනේ.

වනාන්තර ගත වන්නේ බීඩි කොළ කැඩීමට වුව ද ඒ ගමනක දී සෙසු වනජ හමු වූ විට ඒවා ද රැස්කර ගැනීම සාමාන්‍ය සම්ප්‍රදාය යි. නමුත් ඒ ඒ වර්ගවල බහුලතාව හෝ දුලබතාව වසරේ ඍතු අනුව වෙනස් වේ.

> "කරාඩුගල කියන ගමේ ගොඩක් ඉන්නේ ආදිවාසී අය. එයාලගෙ පළමු පරපුරේ අය කැලේට ආදරයෙන් හිටියා. දෙවැනි පරම්පරාව තමයි ඉක්මනට සල්ලි හොයන්න කැලේට හානි කරන්ඩ යොමුවුණේ. ඒ ඒ කාලෙට අනුව නෙල්ලිවලට ගියහම බීඩි කොළක් කඩාගෙන එනව. අරළු වගේ දේවලුත් එකතු කරා. අරළු, බුළු, නෙල්ලි නම් අවුරුද්දකට වාරයයි හැදෙන්නේ".

### 8.2.3. මී කැඩීම සහ බඹර කැපීම

මී කැඩීම සුලභ ව සිදු කරන වනජ රැස්කිරීමේ ව්‍යාපෘතියක් නොවූව ද එය වටිනාකමින් සෙසු වනජ ද්‍රව්‍ය ඉක්මවා යයි. මේ වන විට මී පැණි බෝතලයක මිල රුපියල් 4000 - 5000ක් පමණ වේ. වෙනත් වනජ රැස්කිරීමට වනගත වූ අවස්ථාවක දී අහම්බෙන් හමු වන මීවද ගැමියන් විසින් කඩා පැණි රැස් කරනු ලබයි. කොළ අත්තක බැඳි දුම් ගොටුවක ආධාරයෙන් මී මැස්සන් පලවා හැර මී වද කඩා ගන්නා අතර බොහෝ විට මීය බැඳ තිබෙන ගස් බෙනය කොටා එහි විවරය පළල් කරගත යුතු ය. එය දුෂ්කර සහ අවදානම් කාර්යයක් වෙයි. කෙසේ වුවත් මේ වන විට කැලයේ මී වද සුලභ නොවන බව ගැමියන් නිරීක්ෂණය කර ඇත. මී කැඩීම සම්බන්ධයෙන් පූර්වයෙහි පැවැති අභිචාර හෝ මැස්සන්ට හානි වීමට තිබෙන හැකියාව අවම කිරීමේ උපායමාර්ග වර්තමාන පරපුර විසින් අනුගමනය නොකෙරෙන බවට බොහෝ වැඩිහිටියෝ චෝදනා කරති.

බඹර කැපීම ද ප්‍රධාන ජීවන විධියක් ලෙස පැවත තිබෙන අතර මේ වන විට එහි එතරම් යෙදීමක් දක්නට නැත. කරාඩුගල ආදිවාසී උරුමයක් තිබෙන ප්‍රජාව පමණක් සුළු වශයෙන් බඹර කැපීමේ නියුක්ත වෙති.

### 8.2.4. දඩයම

අතීතයේ දඩයම සම්ප්‍රදාය විසින් පාලනය කරන ලද කාර්යයක් වූ අතර එය ගම්මානයේ මාංශ අවශ්‍යතාව සම්පූර්ණ කරන ලදී. මාංශ අලෙවියක් සිදු නො වී ය.

> "ඒ කාලේ කිව්වේ දඩ වඩිනවා කියලා. ගැබ්ගත් සතෙකුට වෙඩි තිබ්බේ නැහැ. දෙනකට වෙඩි තිබ්බේ නෑ. වතුර හොයාගෙන ආව සතෙකුට වතුර කඩකදී වෙඩි තිබ්බේ නෑ. පැටියෙක් ඉන්න සතෙකුට වෙඩි තිබ්බේ නෑ.  කැමට තමයි මරා ගත්තේ. ඇත්තටම ඉස්සර වුණේ දඩයමෙන් කැලේ සත්තු පාලනය කිරීමක්".

නමුත් වර්තමානය වන විට සත්ත්ව දඩයම නීති විරෝධී වුවත් විවිධ විනාශකාරී ක්‍රම භාවිතයෙන් දඩයම් සිදුකරනු ලබයි. එය පූර්වයෙහි වූ සියලු ම හර පද්ධතීන් නො සලකා තිබෙන ආකාරය පෙනේ. එපමණක් නොව මේ වන විට දඩයම සිදු වන්නේ ග්‍රාමීය ප්‍රජාවගේ අවශ්‍යතාව සඳහා නො ව ඉක්මන් මුදල් ඉපයීමේ වාණිජ පරමාර්ථයෙනි. එනිසා මේ වනාන්තරය ජීව විශේෂවල පැවැත්මට දැඩි තර්ජනයක් ව පවතින බව පැහැදිලි වේ.

"ඉස්සර මුව රංචුවක සීයක් විතර හිටිය. දැන් එකෙක් දකින්නත් හරිම අමාරුයි. දැන් සත්තු කයියක් හිටියොත් සේරටම වෙඩි තියෙනවා. එකෙක් මැරෙනවා. තව ටිකකගේ කකුල් කඩාගෙන යනවා. තැන තැන මැරිලා යනවා. ඕක තමා දැන් වෙන්නෙ. ඉතිං සත්තු ඉතුරු වෙයි ද?"

"දෙවනි පරම්පරාවෙ අය සත්තු සමූල ඝාතනය කළා. නිල්ගල කැලේ දැන් අභය භූමියක් නෙමේ. සත්තුන්ට බය භූමියක් වෙලා තියෙන්නේ. දැන් කොටහළු ගෙයක් වුණත් වනජීවී එකට ෆොරස්ට් එකට ඇස් වහලා කැලේ සතෙක් මරාගෙන එනවා. ඉස්සර බිස්නස් එකට දඩයම් කළේ නෑ. දැන් නිල්ගල දඩයමට තියා දකින්නවත් සතෙක් නෑ. ඉස්සර හොඳට බලල තමයි දඩයම කළේ. දැන් ඉබාගාතේ තමයි දඩයම් කරන්නේ".

ඊටත් පස්සෙ රෑට ගිහින් ටෝච් ගහලා වෙඩි තියන්න පටන් ගත්තා. ඇස් දෙක දෙන ඕනම සතෙකුට වෙඩි තිබ්බා. දැන් වගා රකින්ට ඌරන්ට වගේ කරන්ට් එකක් දානවා. කැලේ ලස්සන වෙන්න සත්තු ඉන්න ඕනේ. දැන් නිල්ගල සත්තු නෑ.

සම්මුඛ සාකච්ඡාවලින් පමණක් නොව අපගේ නිරීක්ෂණ අනුව ද පැහැදිලි වූයේ වන සතුන් දඩයම් කිරීම දුලබ සංසිද්ධියක් නොවන බව යි. පර්යන්ත ගම්මානවලින් නිරීක්ෂණය නොවුව ද ප්‍රධාන මාර්ගයට සම්බන්ධ නාගරික භෝජනාගාරවල දඩමස් හොර රහසේ අලෙවි කෙරෙයි. මේ දඩමස්වල මූලාශ්‍රය නිල්ගල වනාන්තරය විය හැකි ය.

8.2.5. වෙනත් ඖෂධ එකතු කිරීම

වනාන්තරය මෙන් ම ගෙවත්ත ද, ගම්මානය සහ වනාන්තරය අතර ලඳු කැලෑ ද ගැමියන්ට සිය ඖෂධ අවශ්‍යතාව සපුරන මූලය වෙයි. සෑම ගැමියෙක් ම පාහේ දෛනික ජීවිතයේ දී මුහුණ දෙන සුළු අනතුරු සහ අසනීප සඳහා භාවිත කරන්නේ සාම්ප්‍රදායික දැනුම මත පදනම් වූ අත්බේත් ය. ඊට අමතර ව පාරම්පරික ව සාම්ප්‍රදායික සිංහල වෙදකම ප්‍රගුණ කළ පාරම්පරික වෙද පරම්පරාවල අය ද ද නිල්ගල වනාන්තරය වටා සිටිති. ඔවුන්ගේ විශේෂඥතාව විවිධ ක්ෂේත්‍ර ඔස්සේ විහිදී ඇත. ඇස් වෙදකම, සර්වාංග, ගෙඩි වෙදකම, හන්දි වෙදකම ආදී වශයෙනි. ඊට අමතර ව ගවාදී සතුන්ට වෙදකම් කරන පුද්ගලයෝ ද සිටිති.

"අත්බේත් ගමේ හැමෝම වගේ දන්නවා. හැමෝම පාවිච්චි කරනවා. ඒවාට ගන්න ගොඩක් දේවල් ගමේ ගෙවතුවල තියෙන නිසා හැම දේකටම කැලේට යන්න ඕන කමක් නෑ".

8.2.6. ඖෂධ වර්ගීකරණය

නිල්ගල වනාන්තරය පොදු ජනතාව අතර වඩා ප්‍රචලිත ව ඇත්තේ ඖෂධ උද්‍යානයක් වශයෙනි. එය ජනශ්‍රැති මූලාශ්‍රය හරහා ඉපැරණි රජ දවස සහ ඊටත් පූර්වයෙහි පැවැතියා යැයි විශ්වාස කරන රාවණ අවධිය දක්වා විහිදී යන බව කියැවේ. පහත වගුවෙන් (වගුව අංක 01) දැක්වෙන්නේ නිල්ගල වනාන්තරයෙන් වර්තමානය වන විට ගැමියන් රැස්කරන ඖෂධ විශේෂයන් ය. නිසැක ව ම මේ ලැයිස්තුව මෙයට වඩා දිගු විය හැකි අතර මෙහි දක්වා තිබෙන්නේ ඔවුන් විසින් අලෙවිය ඉලක්ක කර ගෙන විවිධ ප්‍රමාණයන්ගෙන් රැස්කරනු ලබන ඖෂධ වර්ග වේ. මේවා රැස්කිරීම, සැකසීම සහ භාවිතය යන සමස්ත ක්‍රියාවලිය පිළිබඳ දැනුම සාම්ප්‍රදායික දැනුම් පද්ධතිවලට අයත් ය. මෙම වගුව වනජ වර්ග ඉදිරිපත් කරන වගුවෙන් වියුක්ත ව දක්වා ඇත.

වගුව අංක 01 නිල්ගල වනාන්තරයේ ඖෂධ වර්ගීකරණය

| වර්ගීකරණය | | | |
|---|---|---|---|
| ඖෂධ | උප වර්ගීකරණය | විශේෂය | විස්තරය |
| | කාෂ්ඨීය ශාක | අරළු<br>බුළු<br>නෙල්ලි<br>ඇහැළ<br>ගම්මාළු<br>කහට<br>නා<br>බෝමී<br>වා<br>පිහිඹියා | වඩා වැඩි අවධානයක් යොමු වී ඇත්තේ අරළු, බුළු සහ නෙල්ලි යන විශේෂවලට යි. නමුත් අනෙක් විශේෂ ද ඖෂධීය ගුණයෙන් දෙවැනි නො වේ. මෙම ශාකවල පස් පංගුව එනම්, මුල්, පොතු, ඵල, මල් සහ කොළ යන කොටස් ඖෂධ වශයෙන් භාවිත කෙරේ. ගම්මාළු වැනි විශේෂවල කිරි, ඖෂධ ලෙස භාවිත කෙරේ. |
| | කාෂ්ඨීය පඳුරු | දුනුමැල්ල | කුඩුම්බේරිය පත්‍ර බීඩි කොළ ලෙස හැඳින්වෙන අතර |

| | | | |
|---|---|---|---|
| | | කුඩුම්බේරිය | ඒවායේ එල ද ඖෂධීය වටිනාකමකින් යුක්ත ය. |
| | අකාෂ්ඨීය ශාක | පොල්පලා<br>විෂ්ණු ක්‍රාන්ති<br>ඒකාවේරිය<br>බිං කොහොඹ<br>ප්‍රාණ ජීව<br>කොහිල<br>නවහන්දි<br>අරංකහ<br>වදකහ<br>අස්වැන්න<br>වලගසාල් | මේ පැළෑටි අත් බෙත් සඳහා මෙන් ම පාරම්පරික සිංහල සහ ආයුර්වේද වෙදකම් සඳහා ද එක ලෙස යොදා ගනී. බිං කොහොඹ, ප්‍රාණ ජීව වැනි විශේෂ, වනාන්තරයේ අභ්‍යන්තරයට ගොස් සොයා ගත යුතු අතර පොල්පලා වැනි විශේෂ ගම්මානය මායිමේ වුව දැකිය හැකි ය. |
| | අකාෂ්ඨීය වැල් | කහඹිලියා<br>හාතවාරිය<br>රසකිඳ<br>නගාමැරූ අල | මේවායේ පත්‍ර, අල මෙන් ම සමස්ත ශාකය ම ඖෂධ සඳහා භාවිත කරයි. අත්බෙත්වල දී හාතාවාරිය සහ රසකිඳ වැදගත්ය වැදගත් ය. |
| | කාෂ්ඨීය වැල් | කොතල හිඹුටු | දියවැඩියාව සඳහා අත්දුටු ඖෂධයක් ලෙස පිළිගැනේ. |
| | අපි ශාක | නව හන්දි<br>මහ හැඩයා<br>ගුරුළු රාජ | සාම්ප්‍රදායික සිංහල වෙදකමේ දී අස්ථි සහ විෂ නැසීම සඳහා මෙම විශේෂ භාවිත කරයි. |
| | අර්ධ සත්ත්ව ඖෂධ | මී පැණි<br>බඹර පැණි<br>කණ මී පැණි<br>දඬුවැල් පැණි | මී පැණි සහ බඹර පැණි සහ ඒවායේ ඉටි ඖෂධ සහ අලෙවිය සඳහා යොදා ගනී. කණ මීපැණි සහ දඬුවැල් පැණි බොහෝ විට භාවිත වන්නේ ඖෂධ වෙනුවෙනි. දඬුවැල් කෝටුව, එනම් දඬුවැල් බෑය බැඳ තිබූ අත්ත දුර්ලභ ගුණයක් සහිත වූවක් බව ජනමතය යි. |

(කර්තෘ විසින් සකස් කර ඇත)

8.3. වනජ ද්‍රව්‍ය වර්ගීකරණය

නිල්ගල වනාන්තරය පර්යන්ත ප්‍රජාව බහුවිධ වනජ ද්‍රව්‍ය වසර පුරා රැස් කරයි. මේවා ප්‍රධාන අරමුණු දෙකක් ඉලක්ක කර ගනී. එනම්, අලෙවිය සහ දෛනික පරිභෝජනය යි. ඇතැම් වනජ මේ අරමුණු ද්විත්වය ම අරමුණු කරගෙන රැස් කරයි. මේ වනජ රැස් කිරීමේ සුවිශේෂත්වය වන්නේ එය ඍජු ව ම සාම්ප්‍රදායික දැනුම මත පදනම් වීම යි. එනිසා මෙම ජීවන ව්‍යවහාරය ඔවුන්ගේ දෛනික ජීවිතයට කරන බලපෑම සැලකිය යුතු තරම් ප්‍රබල ය. පහත දැක්වෙන වර්ගීකරණය (වගුව අංක 02) උපයෝජනය පදනම් කරගත්තකි.

වගුව අංක 02 නිල්ගල වනාන්තරයේ වනජ වර්ගීකරණය

| **වර්ගීකරණය** | | | |
|---|---|---|---|
| **ආහාර** | **උප වර්ගීකරණය** | **විශේෂය** | **විස්තරය** |
| | අල වර්ග | කටු අල<br>ගෝනල<br>කොහිල<br>හිරිතල අල | මේ වර්ග වර්ෂයේ එක් කලක දී පමණක් ප්‍රජාවට ආහාර මූලය වේ. මෙය ප්‍රධාන ආහාරයකට වඩා විකල්ප ආහාර මූලාශ්‍රයක් ලෙස සැලකිය හැකි ය. වගා නො කරයි. |
| | කොළ/පලා වර්ග | කෙකටිය<br>හාතවාරිය<br>පොල්පලා<br>මඩු<br>වඩිග කොළ<br>තෙලටිය කොළ<br>මැල්ලදුම්<br>කොළ<br>කොහිල<br>තෙබු<br>අගුණ කොළ<br>උළු කැන්ද | වසර පුරා මේවා ප්‍රයෝජනයට ගන්නා අතර ව්‍යංජන හෝ මැල්ලුම් සැකසීම සඳහා යොදා ගනී. මේවා ආහාර ලෙස සකස් කර ගන්නා ආකාර විවිධ වන අතර ඒ සඳහා සාම්ප්‍රදායික දැනුම අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| | හතු වර්ග | හුඹස් හතු<br>රතු පස් හතු<br>ඉගුරුල්ලා හතු<br>කිරි හතු<br>කුට්ටං හතු<br>යක හතු<br>දඹ හතු | හතු වර්ග වසරේ විවිධ කාලවල දී වනාන්තරයේ නිශ්චිත ස්ථානවල දී මතු වේ. විශේෂයෙන් වර්ෂා කාලයේ දී සහ ඉන් පසු හතු වර්ග මතු වීම වැඩි ය. විෂ සහිත හතු වර්ග ද පවතින බැවින් ආහාරයට ගත හැකි තෝරා ගැනීම සහ ඒවා ආහාරයට සුදුසු පරිදි සකස් කර ගැනීම සාම්ප්‍රදායික දැනුම් පද්ධතිවලට අයත් කාර්යයකි. |
| | ඇට/ඵල | මඬු<br>තිබ්බටු | මඬු දළු මෙන් ම මඬු බීජවලින් මඬු පිටි සකසා ගත හැකි ය. තිබ්බටු වැනි ආහාර ද්‍රව්‍ය වනාන්තරයේ අත්හැර දමන ලද හේන් ආශ්‍රිත ව නිරීක්ෂණය කළ හැකි ය. |
| | පළතුරු | පළු<br>වීර<br>නෙල්ලි<br>කෝන්<br>ගල් සියඹලා | මේවා වාර්ෂික ව ඵල දරන ශාක වේ. වීර සහ පළු වියළි මෝසම් වනාන්තරවල දී මෙන් සුලබ නැත. නෙල්ලි සාපේක්ෂ ව පුළුල් ව්‍යාප්තියක් ඇත. ප්‍රවණතාව නම් පරිණත ශාකවල ඵලදාව අඩු වීම යි. |
| දර | | ඇහැළ<br>නා<br>කහට<br>බුළු<br>ගම්මාළු | එක් විශේෂයක් හෝ කීපයක් සුවිශේෂී ලෙස දැක්වීම අසීරු ය. අවශ්‍යතාව සහ සුලභතාව අනුව සපයා ගනී. |
| දැව | ඉදිකිරීම් දැව | කහට<br>පිහිඹියා<br>බුළු<br>ගම්මාළු | වනාන්තරයේ ඉහළ දැවමය අගයක් තිබෙන විශේෂ කෙරෙහි අවධානය යොමු කර තිබෙන බව ඉදිකර තිබෙන නිවාසවලට යොදා තිබෙන දැව විශේෂ අනුව පැහැදිලි වේ. වර්තමාන ප්‍රවණතාව නම් ගෙවත්තේ තිබෙන තේක්ක, හල්මිල්ල වැනි දැව විශේෂවලට යොමු වීම යි. |

| | | | |
|---|---|---|---|
| | | | |
| | කෝටු / පොලු | ඇහැළ<br>බුරුත<br>ගම්මාළු<br>නා | උදලු, කැති, පිහි ආදී ආයුධවලට මිට ගැසීම සඳහාත්, වෙනත් කෘෂි කාර්මික සහ දෛනික ගෘහ උපකරණ සඳහාත් සාම්ප්‍රදායික දැනුම පදනම් කරගත් තේරීම ඔවුන් සතු ය. |
| නිෂ්පාදන ද්‍රව්‍ය | අර්ධ සත්ත්ව ආහාර | මී පැණි<br>බඹර පැණි | මේවා ඖෂධ සඳහා රැස් කරන අතර බොහෝ විට අලෙවි කිරීම ද සිදු කරයි. වසරේ මේවා නෙළා ගන්නා කාල තිබෙන නමුත් වර්තමාන යෙදීම තිරසර නොවන විනාශකාරී එකකි. |
| | සෙවිලි ද්‍රව්‍ය | මානා<br>ඉළුක් | අතීතයේ මෙන් නිවෙස් සෙවිලි කිරීම සඳහා භාවිත නොවෙතත්, ගව මඩු, දරමඩු, හේන් සහ කුඹුරුවල මුර පැල් ආදිය සෙවිලි කිරීම සඳහා යොදා ගනී. |

(කර්තෘ විසින් සකස් කර ඇත)

8.4. අභිචාර සහ සම්ප්‍රදායන්

විවිධ කාර්යන් සඳහා වන ගත වීම අවදානම් කාර්යයක් වන බැවින් ගැමියෝ නොපෙනෙන බලවේගයන්ගෙන් රැකවරණය පතති. තාක්ෂණික දියුණුවක් නොතිබූ මුල් කාලවල දී මේ අභිචාරයන් දැඩි ව ගැමියන් විසින් අනුගමනය කරනු ලැබ ඇත. ප්‍රදේශීය දේව මණ්ඩල ඔවුන්ගේ විශ්වාසයන්ට මූලය වී තිබේ.

> "කැළේට යනකොට ගණ දෙවියෝ අදහන අය අත්තක් බිඳලා යනවා. අලින්ට කතා කරන ගුරුකම් කරගෙන යන අයත් ඉන්නවා. කලාතුරකින් තමයි අලියෙක් ගහල මිනිහෙක් මැරෙන්නේ. අලි ඉන්න කැලේ ගිහින් මිනිස්සු සේරම කරගෙන ආන්තරාවක් නැතුව ආපහු එනවා".

වර්තමානයේ දීත් වැඩිහිටි පරම්පරාවට අයත් සාමාජිකයන් මේ අභිචාර නියමාකාරයෙන් පිළිපැදීමට උනන්දු වුවත්, ඔවුන් චෝදනා කරන්නේ වර්තමාන තරුණ පරම්පරාව ඒවා නො සලකා කටයුතු කරන බවත් එහි ප්‍රතිඵල ලෙස වනාන්තරයට මෙන් ම ඔවුන්ට ද හානි වීම වැළැක්විය නොහැකි තත්ත්වයකට පත් ව තිබෙන බව යි.

"ගම්භාර දෙවියන්ට භාර වෙනවා. අපි යන්නේ සත්තුන්ට හිරිහැර කරන්න නෙමෙයිනේ. බෙහෙතක් වගේ දෙයක් හොයාගන්න. බාර වෙලා තමයි කැලේ වදින්නේ. අවුරුද්ද අවසානේ තමයි භාර ඔප්පු කරන්නේ. හාමාපොළ දෙවියන්වහන්සේ කියලා බණ්ඩාර දෙවි කෙනෙක් ඉන්නවා. අපි මේ දේවාලවලට තමයි යන්නේ. පිටකුඹුර ගම ළඟ තමයි දේවාලේ තියෙන්නේ. දැන් හැදෙන කොල්ලෝ නම් ඕවා කරන්නෙ නෑ".

මේ විශ්වාස සහ අභිචාර වර්තමාන තාක්ෂණික සහ මතවාදීමය ප්‍රවාහ හමුවේ සේදී යන ආකාරය නිරීක්ෂණය වේ. ජංගම දුරකතනය සහ එහි අඩංගු විවිධ උපාංග ඔවුන්ගේ සුලබ සහ විශ්වසනීය ‍රැකවලුන් බවට පත් ව තිබේ.

8.5. කැලෑ ගිනි පාලනය

නිල්ගල වනාන්තරයෙ ව්‍යූහය සහ සංරචක වෙනස් වී තිබෙන බව ගැමියන්ගේ නිරීක්ෂණයකි. එයට ප්‍රධානතම හේතුව ලෙස ඔවුන් හඳුනා ගෙන තිබෙන්නේ වන සංරක්ෂණ උපායමාර්ගයක් ලෙස වනාන්තරය ගිනි තැබීම තහනම් කිරීම සහ ගිනි ගැනීම් පාලනයට පියවර ගැනීම යි. ගැමියන්ට අනුව නිල්ගල වනාන්තරයේ පැවැත්මට වාර්ෂික ව මිනිසුන් ඇති කරන ගිනි අවශ්‍ය වේ.

"කැලෑ ගිනි වළක්වමු කියන පාඨය ඔය මෑතකදි නේ ආවේ. මේකේ ගින්දර ගියේ නිකන් නෙවෙයි. මිනිස්සු ගිනි ගහල තමයි ගියේ. ගින්දර වලට මේ ගස් මැරුණේ නෑ. මේ රස්නෙ හා දුම නිසා තමයි එළදාව හොඳට තිබුණේ. දැන් ගිනි නැති නිසා එළදාව අඩුයි. ඉස්සර වගේ මී-බඹරත් නෑ. කැලෑ ගිණි වැළැක්වීම නිසා තමයි මේක වුනේ. ඉස්සර නිල්ගල කැලේ තිබුණේ මෙහෙම නෙමෙයි. අපේ මේක අපේ අත්දැකීම. අපි මේ නිල්ගල උපන් අය".

ගිනි ඇති කිරීම පාලනයක් සහිත ව ගැමියන් විසින් සිදුකරන ලද ක්‍රියාවක් බව පෙනේ. වසර ගණනාවක් තිස්සේ ගිනි ගැසූ පතන්වල ශේෂ වී තිබෙන කාෂ්ඨීය ශාකවල කඳ සහ අතු ස්වභාවය පරීක්ෂා කිරීමෙන් පැහැදිලි වන්නේ ඒ ශාක පවා ගින්නට ඔරොත්තු දෙන පරිදි අනුවර්තනය වී තිබෙන බව යි.

"දැන් මේ කට්ටියගෙ නීතිය නිසා කැලේ ගිනි ගහන්නේ නෑ. ගිනි තිබ්බොත් අල්ලගෙන යනවා. ඒ නිසා කැලේ හැදෙන දෙයක් හැදෙන්නෙත් නෑ. ගිනි ගහනවා කියලා මිනිස්සු කඳුවලට, මහ මූකලන් වලට ගිනි ගැහුවෙ නෑ. ගිනි

> ගහන්නෙ පතන්වලට. අපිට ඕකට කියන්නේ මානම කියල. දැන් ඒ ඉලුක්, මානා කැලි වලට ගිනි වදින්නෙ නැති නිසා සතෙකුටවත් කන්න දෙයක්වත් ඒවයේ හැදෙන්නේ නෑ".

පතන් බිම්වලට ගිනි තැබීම දීර්ඝ කාලයක් තිස්සේ සිදු වන ක්‍රියාවලියක් බව බොහෝ මූලාශ්‍රයවලින් අනාවරණය වේ. එනිසා මේ පතන් බිම්වල ජීවත් වන ජෛව ප්‍රජාව එයට අනුවර්තනය වී තිබෙන බව නිරීක්ෂණය වේ. නමුත් මේ ක්‍රියාවලිය සනාථ කිරීම සඳහා දීර්ඝ කාලීන ව සිදුකරන ලද අධ්‍යයනයක ප්‍රතිඵල අවශ්‍ය වේ.

8.6. වන සහ වනජීවී සංරක්ෂණ නීති සහ කළමනාකරණ උපායමාර්ග

නීති සහ නීතිය ක්‍රියාත්මක කරන රජයේ ආයතන පැවැතියත් ඔවුන් නීතිය නිසි අයුරින් ක්‍රියාවේ යොදවන්නට අසමත් ව ඇති බව පෙනේ. එහි අනිවාර්ය ප්‍රතිඵලයක් ලෙස නීතිය පිළිබඳ සහ නිලධාරීන් පිළිබඳ විශ්වාසය ගැමියන් වෙතින් තුරන් වෙමින් තිබේ. එපමණක් නො ව එය ඉන් නො නැවතී නිලධාරීන් හා රාජ්‍ය යාන්ත්‍රණය කෙරෙහි ඔවුන් තුළ විරෝධාකල්ප ගොඩ නැගෙමින් තිබේ.

> "වනජීවියෙන් හිටියත් බලවතුන්ට ඕන දෙයක් කරන්න පුළුවන්. ගමේ මිනිස්සුන්ට තමයි මුකුත් කරන්න බැරි. අල්ලගෙන ගිහිං දඩත් ගහලා, පොලිසියටත් ගෙනිහින්, නඩුවකුත් දානවා. ඔන්න ඕක තමයි නීතියෙන් අපිට තියෙන සහනය".

නීතියේ ආධිපත්‍යය බිඳී යාම වනජීවී සහ වන සංරක්ෂණ ඉදිරිදැක්ම සහ විභවතාව විනාශ කරන බව පෙනේ. මේ තත්ත්වය සමස්තයේ සිදු කිරීමට අපේක්ෂා කරන සාධනීය වෙනස්කම් සඳහා ඍජු ව බලපෑම් කරනු ඇත.

> "දැන් නීතිය තැනක නැමෙනවා. තැනක දිගැරෙනවා. මේක හරිම භයානක තැනක තියෙන්නේ. මම ගහක් කැපුවොත් නීතියෙන් ලොකුම දඬුවම මට දෙනවා. කවුරු හරි ලොක්කෙක් අක්කර දහයක් අල්ල ගත්තත් මොකුත් නෑ".

8.7. උපයෝගීතාවේ වෙනස් වීම

ගැමියන්ගේ ප්‍රධානතම කියවීමක් වන්නේ කාලීන ව වනාන්තරය උපයෝජනය කිරීමේ දෘෂ්ටිකෝණය වෙනස් වී තිබෙන බව යි. එහි ප්‍රතිඵලයක් ලෙස වනාන්තරයට පර්යන්ත කලාපවලින් එල්ල වන පීඩනය වැඩි වී තිබේ. අනෙක් අතට ගැමියන් ද විවිධ සමාජ,

ආර්ථික සහ දේශපාලන ගතිකයන් හමුවේ තම පූර්ව ආස්ථානවලින් වියුක්ත ව ක්ෂණික මුදල් හා ලාභ උපයා ගැනීමේ අරමුණුවලින් ක්‍රියා කරන බව පැහැදිලි වේ.

> "ඉස්සර ගස්- මස් වෙළෙඳාමක් තිබුණෙ නෑනේ. දැන් සේරම ව්‍යාපාර වෙලා. මේ සේරම විනාශවලට දේශපාලනය තමයි හේතු වෙලා තියෙන්නේ. දැන් තාප්පෙක පෝස්ටරයක් ගහලත් මිනිහෙක් බලාපොරොත්තු වෙන්නෙ රස්සාවක්!"

> "ඉස්සර වැලක් කැපුවත්, කෝටුවක් කැපුවත්, ලීයක් කැපුවත් හොඳට බලලයි ඒක කෙරුවේ. ඉස්සරත් මිනිස්සු ජීවත් වුණා. වගා කරා. ඒත් විනාශ කරේ නෑ. මේ සේරම උනේ ජනගහනය වැඩිවීම සහ දේශපාලන ක්‍රමය නිසා".

අනෙක් අතට ගැමියන් ද කැලයෙන් වියුක්ත ව කටයුතු කිරීමට පෙළඹීමේ ප්‍රවණතාවක් හඳුනා ගත හැකි ය. වන සහ වනජීවී සංරක්ෂණ නීති, වනාන්තරයේ ඵලදායීතාව හීන වීම, වනජ ද්‍රව්‍ය රැස් කිරීමේ අවදානම සහ වෙනත් ආර්ථික සහ සමාජීය අවස්ථා නිර්මාණය වීම ඒ අතරින් ප්‍රධාන ය.

> "කැලේ ඵලදාව නැති නිසා ඉස්සර වගේ දැන් කැලේ යන ප්‍රමාණය අඩුයි. ඉස්සර අපි කැලේ රංචු පිටින් ගියා. දැන් මිනිස්සු වැඩියෙන් ගොවිතැන් වලට යොමු වෙලා. හැමදාම මිනිස්සුන්ට කැලේ යන්න බැහැනෙ. අලි ගහනවා අවදානම තියෙනවා. ඒක නිසා අපටත් වුවමනාවක් තිබුනා කැලෙන් ඈත් වෙන්න".

සංරක්ෂණය සහ මිනිස් අවශ්‍යතා පූර්ණය කිරීම අතර පුළුල් සහ විවෘත කතිකාවක් ආරම්භ කිරීමට මේ විභේදය භාවිත කිරීමේ විභවතාවක් තිබේ. නමුත් ඒ සඳහා තිබෙන අවධානය සැලකිය යුතු තරම් අවම බව පෙනේ.

8.8. තර්ජන

මෙම වනාන්තර කලාපයට දිනෙන් දින ම එල්ල වන තර්ජනවල ස්වභාවය සහ ඒවායේ තීව්‍රතාව වෙනස් වෙමින් තිබේ. මෙම වනාන්තර වසර ගණනාවකට පෙර සිට බහුජාතික සමාගම්වල අන්නාසි, කෙසෙල් වැනි බෝග සඳහා මහා පරිමාණයෙන් යොදා ගන්නට උත්සාහ ගෙන ඇත. ඊට පසු කාලයේ වනාන්තර ඉඩම් රබර් වගාවන් සඳහා අල්ලා ගැනීමේ ප්‍රවණතාවක් ද දක්නට ලැබිණි. මීට පරිබාහිර වශයෙන් පර්යන්ත ප්‍රජාවන්ගේ සමාජ, ආර්ථික සහ දේශපාලන ගතිකයන් සමග ඔවුන් වනාන්තරය සමග පූර්වයේ සිට

පවත්වා ගෙන ආ සබඳතාවේ ස්වරූපය අපේක්ෂා කළ හැකි පරිදි ම මේ වන විට අන්තගාමී උපයෝජනවාදී මාවතකට එළඹ තිබේ.

> "ඔය සියබලාණ්ඩුව පැත්තේ රබර් හිටවන්න කැලේ අල්ලන වැඩක් ගියා. කොට මුදලාලිලාත් ඕකට සම්බන්ධ වෙලා හිටියා. දේශපාලඥයෝ, නිලධාරීන් අල්ලගෙන තමයි ඕක කරලා තියෙන්නේ. පස්සෙ ෆොරස්ට් එකෙන් කැලේ මායිම් දැම්මා".

නිල්ගල වනාන්තරය පර්යන්තයේ සිටින ගැමියන්ට වඩා ගමට පිටින් පැමිණි සහ වෙනත් ප්‍රදේශවලින් පැමිණි අය මෙම ප්‍රදේශයේ සම්පත් ලබාගන්නා බව ගැමියන්ගේ මතය යි. ඔවුන්ට අනුව මේ ක්‍රියාවලිය සඳහා නිලධාරීන්ගේ හා දේශපාලකයන්ගේ ඍජු සබඳතාවක් තිබේ. අනවසර දැව හෙළීම ඉන් එක් ප්‍රධානතම ක්‍රියාවකි. මීට අමතර ව අනවසර දැව හෙළීම, දඩයම් කිරීම සහ ඉඩම් අල්ලා ගැනීම ගැමියන් විසින් හඳුනා ගනු ලැබ තිබේ.

> "දැන් නම් ගස් කැපීම ඇත්තටම නැති තරම්. ගමේ මිනිස්සු ඉස්සරත් ඒකට කැමති වුනේ නෑ. ඒත් ඉතින් දේශපාලන අධිකාරිය ඉක්මවා යන්න බැරි නිසා මිනිස්සු කරබාගෙන හිටියා. දැන් ඔය වත්තක තියෙන තේක්ක ගහක් කපා ගන්නවා ඇරෙන්න මිනිස්සු කැලේ හොරට ගත් කපනවා අඩුයි. එහෙම කළොත් අපි අදාළ අය දැනුවත් කරනවා".

පර්යන්ත ප්‍රජාවගේ දැව අවශ්‍යතාව පූර්ණය කරන්නේ ඔවුන්ගේ ගෙවතු සහ වගා බිම්වල තිබෙන තේක්ක, හල්මිල්ල වැනි ශාකවලිනි. මේ මගපෙන්වීම වනජ ද්‍රව්‍ය සම්බන්ධයෙන් ද අනුගමනය කිරීමේ හැකියාවක් තිබේ. විශේෂයෙන් ම පර්යන්ත කලාපීය ගෙවතු සහ වගාබිම් වනාන්තරය වටා සීමාන්තරික කලාපයක් ලෙස සංවර්ධනය කිරීමේ විභවතාවක් හඳුනා ගත හැකි ය. ඒ සඳහා ප්‍රජාවගේ විභවතාවක් ද පවතිනු දැක ගත හැකි ය.

8.9. තිරසර උපයෝජන උත්සාහයන්

ගම්මානවල ක්‍රියාත්මක වන ස්වේච්ඡා සංවිධාන සහ අද්දැකීම් තිබෙන ගමේ වැඩිහිටියන් විසින් සිදු වන ක්‍රියාවලිය ගැන අවබෝධයෙන් අවස්ථා කීපයක දී ඒවා වළක්වා ගනිමින් ඉදිරිගාමී යෝජනා ක්‍රියාත්මක කිරීමට උත්සාහ ගෙන තිබේ. නමුත් මේ උත්සාහයන් ප්‍රායෝගික වැඩපිළිවෙළක් දක්වා සංවර්ධනය කිරීමට රාජ්‍ය අංශයෙන් ප්‍රමාණවත් උත්තේජනයක් සහ අනුග්‍රහයක් ලැබී නොමැත.

"මම වනජීවියක, පොරස්ට් එක, පරිසර එක නිල්ගල, රතුගල මිනිස්සු, රාජ්‍ය නිලධාරීන් ඔක්කොම එකතු කරලා වැඩමුළුවක් සංවිධානය කරන්න ප්‍රාදේශීය ලේකම් එකට කතා කළා. ප්‍රාදේශීය ලේකම් කිව්ව ඒකට සල්ලි නෑ කියලා. මට මේක කොහොම හරි කරන්න ඕන වුන නිසා මම තෙල් වියදමට සල්ලි දෙන්නම් කියලත් කිව්වා. ඒත් කවුරුවත් ඒකට උනන්දු උනේ නෑ. "නිල්ගලට මුල්ගල" කියලා වැඩසටහනක් කරන්නයි මම හිතුවේ. "බීජය පැළයක් වේ පැළය කැලයක් වේ! කැලය ජාතියට බලයක් වේ! එක ගහක් කපන විට දෙකක් සිටුවා ජාතියේ බලය තර කරගමු". මේක තමයි මගේ අදහස උනේ".

වන සහ වනජීවී සංරක්ෂණය සම්බන්ධයෙන් වගකිම් දරන රාජ්‍ය ආයතන, පොලීසිය, ප්‍රාදේශීය ලේකම් කර්යාලය වැනි ගැමියන්ගේ දෛනික ජීවිතයට අදාළ සේවා ලබා දෙන ආයතන වෙනත් සුවිශේෂී ඉදිරිගාමී අරමුණු වෙනුවෙන් ක්‍රියාත්මක වීම විශේෂයෙන් ම, සංරක්ෂණය වැනි පැතිරුණු සහ සංකීර්ණ අර්බුදවලට මැදිහත් වී ඒකාබද්ධ ව කටයුතු කිරීමට අපොහොසත් වන බව නිරීක්ෂණය වේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස මෙම ආයතන ගැන මිනිසුන්ගේ විශ්වාසය බිඳී ගොස් ඇති අතර එනිසා ම ප්‍රජාවගේ ක්‍රියාකාරී සහාය ද අහිමි ව යමින් පවතී.

"ඉඩමක් අල්ලගන්න දුන්නේ නැත්තං ෆොරස්ට් එකත් එක්ක මිනිස්සු තරහයි. වනජීවි එකත් එක්ක මිනිස්සු තරහයි දඩයමට කැළේ යන්න දෙන්නෙ නැති නිසා. මිනිස්සු මේ දෙකම හොරෙන් කරන නිසා නිලධාරීන් මිනිස්සු එක්ක තරහයි. මට ඕන වුණේ මේ දෙගොල්ල ගමේ මිනිස්සුත් එකතු කරලා කැළේ රකින වැඩසටහනක් සංවිධානය කරන්න. කිසිම රාජ්‍ය නිලධාරියෙක් එකම වේදිකාවකට ගේන්න මට බැරිවුණා. හැම දෙයක්ම නීතියෙන් විතරක්ම කරන්න බෑ. මිනිස්සු හදන්න ඕනේ කැලේ රැකගන්න ඕන නම්".

අනෙක් අතට පූර්වයෙහි ප්‍රජා පාදක වැඩසටහන් ක්‍රියාවට නංවා ඒවා නිසි පරිදි අඛණ්ඩ ව ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීම නිසාත්, මිනිසුන් එබදු ව්‍යාපෘති සම්බන්ධයෙන් විශ්වාසයකින් තොර ව කටයුතු කරන බව පෙනේ. මෙය සහභාගිත්ව සංවර්ධනය සහ ප්‍රජා පාදක සංරක්ෂණ ව්‍යාපෘතිවල අනාගත විභවයන් විනාශකර දමයි.

"ඉස්සර අපේ සමිති හරහා අපි මිනිස්සුන්ට කැලේට යන්ට ෆොරස්ට් එකෙන් ෆෝම්ට් එකක් අරන් දුන්නා. ඒකට පොඩි ගාණක් දෙන්න ඕන. අනවසරව යනවාට වඩා අවසර ඇතුව කැලේට යන්න අවස්ථාවක් දෙන එක තමයි අපේ

> අරමුණ වුණේ. ෆෝම්ට් දොළහක් - පහළොවක් විතර හදල දුන්නා. කෙකිවලින් අරලු, නෙල්ලි වගේ දේවල් කඩන්න අවසර තිබුණා. බීඩි කොළත් කඩන්න පුළුවන්. මේවා හරියට හොයලා බැලුවේ නැති නිසා ඒවා එහෙමම යටගියා. අන්තිමේදී මිනිස්සු හොරෙන් කැලේට යන එක පුරුද්දක් කරගත්තා. දැන් ඒක ක්‍රියාත්මක වෙන්නේ නැහැ. දැන් දෙපැත්තෙම තියෙන්නේ අවිශ්වාසය".

8.10. විකල්ප යෝජනා

ගැමියන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ඔවුන්ගේ උපයෝගිතාව වෙනුවෙන් ම නොවන අතර ඒ අතර තිබෙන බොහෝ යෝජනා සමකාලීන ශ්‍රී ලංකාවේ සහ ගෝලීය වශයෙන් ද ප්‍රජා පාදක වනජීවී සහ වන සංරක්ෂණ යෙදීම්, ප්‍රාදේශීය සංවර්ධන සහ සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශ ස්පර්ශ කරයි.

> "කැළේ ගැන ප්‍රායෝගික පර්යේෂණයක් කරන්න ඕන එක එක සෘතුවලදී. කැළේ සිදුවන සියලුම දේවල් නිරීක්ෂණය කරන්න ඕන. මිනිස්සු හමුවෙන්න ඕන. හැම දෙනෙක්ගෙම අදහස් ගන්න ඕන".

නිල්ගල වනාන්තරයේ ඖෂධ උපයෝජනය ඉලක්ක කරගත් ඇතැම් රාජ්‍ය ව්‍යාපෘති මේ වන විට අතරමග නවතා දමා තිබේ. නමුත් ඒවා සම්බන්ධයෙන් ප්‍රදේශයේ ජනතාව තවමත් බලාපොරොත්තු සහගත ය.

> "නිල්ගල ඉස්සර හදපු නාවින්න ආයුර්වේද නිෂ්පාදනාගාරය දැන් බෙහෙත් ශාලාවක් කරල. මේක හැදුවේ මේ කැලෙන් දේවල් අරගෙන බෙහෙත් නිෂ්පාදනය කරන්න. දැන් ඒක සම්පූර්ණයෙන්ම නතර වෙලා. අපි මේක ජනාධිපතිතුමාට, මැති-ඇමැතිවරුන්ට දැනුම් දුන්නත් මුකුත් උනේ නෑ".

රාජ්‍ය ව්‍යාපෘති පමණක් නොව පෞද්ගලික අංශය සමග ද වනාන්තර පර්යන්තයේ තිබෙන වනාන්තර නොවන ඉඩම් සහ ගෙවතු පාදක කරගෙන ඖෂධ වගා කිරීමේ ව්‍යාපෘතියක් ද මේ වන විට අතර මග නවතා තිබේ. මේ ව්‍යාපෘති සම්බන්ධයෙන් ගැමියන්ට තවමත් ධනාත්මක ආකල්පයක් ශේෂ වී තිබේ. නමුත් මේ අඛණ්ඩ ව සිදු වන අසාර්ථක වීම් සහ නොසලකා හැරීම් අනාගත ව්‍යාපෘති සම්බන්ධයෙන් ද ඇති කරන්නේ යහපත් බලාපොරොත්තුවක් නො වේ.

"ලින්ක් කොම්පැනි එක සම්බන්ධවෙලා කැලේ වටේ බෙහෙත් පැල ගස් වවන කැලයක් හදන්න අපි උත්සහ කරා. නමුත් ඒක කරගන්න බැරි වුණා. මිනිස්සු ඒ වගේ වැඩකට සම්බන්ධ වෙන්න කැමතියි. මොකද ඒකෙන් මිනිස්සුන්ට ආර්ථික ප්‍රතිලාභයක් තියෙන නිසා".

නිල්ගල ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ගැමියන් කරන ප්‍රධාන යෝජනාව වන්නේ වනාන්තරයේ මායිම් නිර්ණය කිරීම යි. නමුත් වනාන්තරය තුළ තිබෙන සින්නක්කර ඉඩම් සහ එහි යෙදීම් සමස්ත ක්‍රියාවලිය කෙරෙහි බලපෑම් ඇති කරයි.

"කැලේ මැද සින්නක්කර ඉඩම් තියෙනවා. මිනිස්සුන් ඒ වගේ සත්තු (මී හරක්) දාගෙන ඉන්නවා. එතකොට ඉඩම් නැති අනික් මිනිස්සුත් ඒ වැඩේ කරනවා. සත්තු තණකොළ කෑවට නිලධාරීන් ලොකුවට මැදිහත් වෙන්නේ නෑ. ලොග්ගල්ඔය වනජීවි කාර්යාලය තියෙන්නෙත් සින්නක්කර ඉඩමක".

අනෙක් අතට ගැමියන්ට නිලධාරීන් ගැන තිබෙන අවිශ්වාසය සහ විරෝධාකල්ප හේතුවෙන් ගැමියන් යෝජනා ඉදිරිපත් කරන්නට හෝ ඉදිරිපත් නොවීමේ ප්‍රවණතාවක් ද නිරීක්ෂණය වේ. ඔවුන් තම තමන්ගේ මායිම් වෙන් කිරීම ගැන පමණක් අවධානය යොමු කරන බව පැහැදිලි ය.

"මම නම් යෝජනා කරන්නෙ කැලේ මායිම් දාන්න කියලා. කොහොම වුණත් අපි යෝජනා ගෙනාවට වැඩක් නෑ. නිලධාරීන් අපි කියන ඒවා අහන්නෙ නෑ".


## 9. සාකච්ඡාව

ලෝකයේ සැවනා පරිසර පද්ධති, ඒ මත යැපෙන මිනිසුන් සහ ඔවුන් විසින් නිර්මාණය කරන ලද සාම්ප්‍රදායික දැනුම් පද්ධති එකිනෙකින් වියුක්ත කළ නොහැකි ලෙස බැඳී තිබේ (Galvin and Reid,2010).

නිල්ගල සැවනා වනාන්තර පර්යන්ත ප්‍රජාවගේ සාම්ප්‍රදායික දැනුම් පද්ධති සමඟ බැඳුණු ජීවන ව්‍යවහාරවල තත්ත්ව සහ ප්‍රවණතා විමර්ශනය කරන මෙම අධ්‍යයනයේ සාකච්ඡාව ප්‍රධාන කුලුනු තුනක් මත ගොඩනැගිය හැකි ය. (1. රූප සටහන බලන්න) එනම්, සාම්ප්‍රදායික දැනුම, සංරක්ෂණ නීති හා ප්‍රතිපත්ති සහ සැවනා පරිසර පද්ධතිය යන කුලුනු ත්‍රිත්වය මත යි. ඒවා පිහිටනු ලබන්නේ එකිනෙකට වෙනස් වූ මුල්ගල් මත යි. නිදසුනක් ලෙස සාම්ප්‍රදායික දැනුම, අයිතිය හෝ උරුමය කතිකාවෙන් ජනිත වන විට, සංරක්ෂණ නීති හා ප්‍රතිපත්ති නියෝජනය කරන්නේ ප්‍රමුඛ ධාරාවේ සංරක්ෂණ

හෝ සංවර්ධන කතිකාව යි. එමෙන් ම සැවනා පරිසර පද්ධතිය ජෛව සම්පත් මූලය මත පිහිටයි. එය නියෝජනය කරන්නේ වනාන්තරයේ ජෛව සම්පත් උරුමය සහ ඒවායේ සුවිශේෂීතාව යි. මෙම සියලු ම කුලුනු අවසානයේ වෙනස් වන සමාජ-සංස්කෘතික, ආර්ථික හා දේශපාලන "පුළුල් පදනම" මත පිහිටනු ලබන අතර ඉහත සාකච්ඡා කරන ලද ඒ ඒ කුලුනුවලට අදාළ වන "මුල් ගල්" අතර බන්ධුතාව ගොඩනංවයි.

1. රූප සටහන: නිල්ගල සාම්ප්‍රදායික ජීවන ව්‍යවහාර සංකල්පගත කිරීම




(කර්තෘ විසින් සකස් කර ඇත)

උදාහරණයක් ලෙස වාර්ෂික ව නිල්ගල වනාන්තරයේ තෘණභූමි ගිනිලෑම සාම්ප්‍රදායික දැනුම් පද්ධතිය නියෝජනය කරන ජීවන ව්‍යවහාරයකි. නැති නම් සාම්ප්‍රදායික උරුමයකි. නමුත් වත්මන් වනජීවී සහ වන සංරක්ෂණ නීති ප්‍රතිපත්තිවලට අනුව එය නීති විරෝධී තහනම් ක්‍රියාවක් බවට පත් කරනු ලැබ තිබේ. මෙය ඍජු ව ම නියෝජනය කරන්නේ සමකාලීන ගෝලීය සංරක්ෂණ සහ සංවර්ධන කතිකාව අතර ගැටුම යි. නමුත් තවත් පර්යේෂණ පෙන්වා දෙන්නේ ආදිවාසී ප්‍රජාව සැවනා බිම් ගිනි තැබීම කාලයක් තිස්සේ කරන ලද ක්‍රියාවලියක් වන බව යි. ඕස්ට්‍රේලියාවේ ආදිවාසීන් දීර්ඝ කාලයක් තිස්සේ ඔවුන් ජීවත් වන සැවනා බිම් කළමනාකරණයේ යෙදී සිටින අතර සැවනා බිම් ගිනි තැබීම සහ ඒ ගිනි පාලනය මේ ක්‍රියාවලියේ ප්‍රධාන සංරචකයක් ව) තිබේ (Whitehead et al,2003;Preece,2013;McKemey et al.,2020). තවදුරටත් ඔවුන්

පෙන්වා දෙන්නේ මේ යෙදීම් සාම්ප්‍රදායික දැනුම සමග සෘජු බන්ධුතාවක් පෙන්වන බව යි (Whitehead et al., 2003;Preece, 2013; McKemey et al.,2020).

මෙම යෙදීම් ශ්‍රී ලංකාවේ සැවනා ගිනි තැබීමේ සාම්ප්‍රදායික යෙදීම සමග ඇති සබඳතාව නොසලකා හැරිය නොහැකි ය. මේ අනුව පැහැදිලි වන්නේ ප්‍රධාන කතිකාවට පරිබාහිර ව ගැඹුරට මුල්බැසගත් ජීවන ව්‍යහාර පවතින බව යි. නමුත් වත්මන් සංරක්ෂණ නීති හා ප්‍රතිපත්ති යනු ප්‍රධාන කතිකාව නියෝජනය කරන සහ හසුරුවන ප්‍රධාන ම මෙවලම් මිස සෙසු සාම්ප්‍රදායික යෙදීම් කෙරෙහි අවධානය යොමු නොකරන ලද වේදිකාවක් බව යි. ගිනිලෑම තහනම් කිරීම නිසා නිල්ගල වනාන්තරයේ ව්‍යූහය, ක්‍රියාවලිය වෙනස් වී තිබෙන අතර එහි ඵලදායිතාවට බාධා පමුණුවා තිබේ. එහි සෘජු ප්‍රතිඵලය වී තිබෙන්නේ සාම්ප්‍රදායික දැනුම පදනම් කරගත් වනගත ජීවන ව්‍යවහාරවල යෙදෙන නිල්ගල පර්යන්ත ප්‍රජාවට බාධා එල්ල වීමයි. අනෙක් අතර එය විනාශකාරී වනාන්තර උපයෝජනය කිරීමේ ප්‍රවණතාව තීව්‍ර කරන්නට ද උත්තේජනයක් සපයයි. අවසානයේ මේ තත්ත්වය ප්‍රමුඛ ධාරාවේ තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට බාධා පමුණුවන අතර එහි සම අවකාශයට ඔබ්බෙන් පිහිටයි. අප්‍රිකානු කලාපයේ සැවනා පරිසර පද්ධති, එයින් සැලසෙන සේවා සහ ඒවා මත යැපෙන මිනිසුන් පිළිබඳ ව අධ්‍යයනය කරන Olorunfemi et al., (2016) පෙන්වා දෙන්නේ සැවනා පරිසර පද්ධති මත යැපෙන ප්‍රජාවන් ඒවායින් සැලසෙන සේවාවන් වර්ධනය කර ගැනීම සඳහා සැවනා බිම් කළමනාකරණය තම දැනුම භාවිතයෙන් සිදුකරන බව යි. එපමණක් නො ව, ග්‍රාමීය ආහාර සුරක්ෂිතාව තහවුරු කිරීම සහ ග්‍රාමීය ප්‍රජාවන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා සැවනා බිම් සහ ඒ ඇසුරෙන් සංවර්ධනය කර ඇති සාම්ප්‍රදායික දැනුම් පද්ධතිවල වැදගත්කම ද මෙහි දී අවධානයට ලක් ව තිබේ (Moloise et al.,2024). දකුණු ඇමරිකානු සැවනා පිළිබඳ කරන අධ්‍යයනයකින් පෙන්වා දී තිබෙන්නේ, සැවනා පරිසර පද්ධතිවල විවිධත්වය සහ ඵලදායිතාව වැඩි කිරීම සඳහා ඒවායේ ජීවත් වන ප්‍රජාවන් තම සාම්ප්‍රදායික දැනුම භාවිත කරන බව යි. එම පර්යේෂණය තව දුරටත් පෙන්වා දෙන්නේ සාම්ප්‍රදායික දැනුම බැඳි ජීවන ව්‍යවහාර සහ සැවනා බිම්වල පැවැත්ම එකිනෙකින් වෙන් කළ නොහැකි බව යි (Ferreira et al.,2022). මේවායේ තිබෙන ඇතැම් ශාක විශේෂ පරිසර විද්‍යාත්මක වශයෙන් මෙන් ම පරිසර පද්ධති සේවා සැපයීම සම්බන්ධයෙන් ද වැදගත් වන බව තවත් පර්යේෂණවලින් පෙන්වා දී තිබේ (Sousa et al.,2013). නිල්ගල සැවනාවේ ඇති අරළු, බුළු සහ නෙල්ලි ශාකවලට ඇති පාරිසරික

සහ සමාජීය වැදගත්කම වෙනත් සැවනාවල දී තවත් ශාක විශේෂ විසින් අත් කර ගනු ලැබ තිබෙන බව අනාවරණය වන අතර එය අරුත් ගන්වන්නේ වන්නේ සැවනා පරිසර පද්ධතිවල අවකාශීය විවිධත්වය සහ ඵලදායීතාව යි.

දෙවන කාරණය නම් සමාජ-සංස්කෘතික, ආර්ථික හා දේශපාලන පදනමෙහි වන චලනයන් සහ කම්පනයන් සමස්ත ව්‍යූහයේ ම පැවැත්මට බලපෑම් ඇති කරන බව යි. නිදර්ශනයක් ලෙස පසු පරම්පරා විනාශකාරී ලෙස වනජ සම්පත් සහ ජෛව සම්පත් උපයෝජනයට පෙළඹී ඇත්තේ ඒ සම්පත් කෙරෙහි ඇති අධික ඉල්ලුම සහ අධික මිල නිසා යැයි නිගමනය කළ හැකි ය. පූර්වයෙහි මේ සම්පත්වලට එබඳු ඉල්ලුමක් සහ ඉහළ මිලක් නො ලැබිණි. එනිසා සම්ප්‍රදාය විසින් එම උපයෝජන රටා පාලනය කළ හැකි විය. නමුත් මේ වන විට ඇතිවී තිබෙන අධික ඉල්ලුම නිසා වනජ සම්පත් මත එල්ල වී තිබෙන පීඩනය නීති මගින් හෝ පාලනය කිරීම අසීරු වී තිබේ. විශේෂයෙන් මෙහි දී අනාවරණය වන ප්‍රධාන කරුණක් වන්නේ රාජ්‍ය අංශයත්, පෞද්ගලික අංශයත් විශේෂයෙන් ම රාජ්‍ය නොවන සංවිධානවල මැදිහත්වීම් යන සියල්ල නිල්ගල සම්බන්ධයෙන් අපේක්ෂිත ප්‍රතිඵල අත්කරදීමට අසමත් ව ඇති බව යි. නමුත් ගෝලීය අද්දැකීම නම්, රාජ්‍ය මැදිහත්වීම් අසාර්ථක වන විට රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික අංශයේ මැදිහත්වීම් සාර්ථක ප්‍රතිඵල අත් කර ගන්නා බව යි. නිදසුනක් ලෙස නිල්ගල වනාන්තර කලාපයේ අලි-මිනිස් ගැටුම් උත්සන්න වෙමින් තිබේ. නමුත් එය සැම සැවනා පරිසර පද්ධතියකට ම පොදු වන්නේ නැත. අප්‍රිකානු සැවනා බිම්වල සත්ත්ව පාලනය කරන සාම්ප්‍රදායික ගෝත්‍රික ප්‍රජාව වන අලින් සමග සහයෝගයෙන් සැවනා බිම් උපයෝජනය කරති (Hoare and Toit,1999). මේ යෙදීම් සැවනා බිම්වලට එල්ල වන මානව පීඩනය අවම කරන්නටත්, සැවනා බිම්වල ජීවී විශේෂ සහ පරිසර පද්ධති සේවා පවත්වා ගෙන යාම තහවුරු කිරීමටත් හේතු වේ. ඇතැම් විට නෛතික බලකිරීම්වලට වඩා මෙවැනි සහයෝගීතා එළඹුම් ඵලදායි විය හැකි අතර ම සැවනා පරිසර පද්ධති සංරක්ෂණය සම්බන්ධයෙන් බලාපොරොත්තු ඇති කරයි. මන්ද බලපැවැත්වෙන නීතිරීති පවා දුර්වල දේශපාලන හා පරිපාලන ක්‍රමවේදය විසින් අඩපණ කොට තිබෙන බැවිනි. මේ සියලු කම්පන ධාරාවන් ව්‍යූහයේ කුලුනු හරහා දිව ගොස් එහි උපරිතලයන් පවා ස්පර්ශ කර තිබෙන බව ප්‍රජාව සමඟ කරන ලද සාකච්ඡාවල දී පැහැදිලි වේ. ප්‍රජාව ඒකාබද්ධ සංරක්ෂණ ප්‍රවේශ සහිත නවයෝජනා ඉදිරිපත් කරන්නේ සහ ඒ සඳහා ස්වයං උත්සාහයන් ගනු ලබන්නේ එහි ප්‍රතිඵලයක් වශයෙනි.

## 10. නිගමනය

ඉහත සාකච්ඡාව අනුව අපගේ නිගමනය ප්‍රධාන ක්ෂේත්‍ර ද්විත්වයක් මත පිහිටා ප්‍රකාශ කළ හැකි ය. එනම් ප්‍රජාව සහ වනාන්තරය වශයෙනි.

පර්යන්ත ප්‍රජාව පූර්වයෙහි තම සාම්ප්‍රදායික දැනුම මත පදනම් වූ තිරසර වනජ ද්‍රව්‍ය හා ජෛව සම්පත් උපයෝජන ක්‍රියාවලියෙන් ක්‍රමයෙන් දුරස් වෙමින් සිටින අතර ඒ වෙනුවට ආදේශ වී තිබෙන්නේ විනාශකාරී උපයෝජන ජීවන විදිහකි. එය ඔවුන්ගේ ඓතිහාසික උරුමයක් වූ වනාන්තරය සමග බැඳි සාම්ප්‍රදායික දැනුම් පද්ධතිය නියෝජනය නොකරන අතර පෝෂණය කරන්නේ ද නැත. අනෙක් අතට මෙම ක්‍රියාවලිය වනාන්තරයේ තිරසර පැවැත්මට සහ එහි ජෛව-අජෛව සංචරකවල පැවැත්මට ද  බාධා පමුණුවා තිබේ.

වනාන්තර සහ වනජීවී සංරක්ෂණ උපායමාර්ගයක් ලෙස සැවනා (පතන් බිම්) ගිනිලෑම වළක්වා තිබෙන නිසා වනාන්තරයේ ව්‍යුහය හා ක්‍රියාවලියට බලපෑම් එල්ල වී තිබීම දෙවන කාරණය ලෙස ගැණිය හැකි ය. එය ප්‍රජාවගේ දෘෂ්ටිකෝණයෙන් වනාන්තරයේ ඵලදාව අහිමිවීමට හේතු වී තිබේ. නමුත් ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ, ජෛව විවිධත්ව සංරක්ෂණය සම්බන්ධයෙන් කෙරෙන සාකච්ඡාවල දී ළැව්ගිනි පාලනය අවශ්‍ය කාර්යයක් බව පිළිගනී. නමුත් මේ සම්බන්ධ ව ස්වභාව විද්‍යාඥයන් අතර පවා ඒකමිතියක් නොමැති බව පෙනේ (Perera,1975; Pemadasa,1990).

මේ අනුව නිගමනය කළ හැක්කේ නිල්ගල සැවනා වනාන්තරය පර්යන්ත ප්‍රජාවගේ සාම්ප්‍රදායික දැනුම මත පදනම් වූ වනගත ජීවන ව්‍යවහාරවල පැවැත්ම අභියෝගයට ලක් ව තිබෙන බවත්, එය සැවනා වනාන්තරයේ පැවැත්මට, ක්‍රියාවලියට හා ඵලදායිතාවට බලපෑම් කොට ඇති බවත් ය. මෙනිසා ප්‍රජා පාදක වන සංරක්ෂණ සහ වනජීවී සංරක්ෂණ උපායමාර්ගයක් වශයෙන් පර්යන්ත ප්‍රජාවගේ වනගත ජීවන ව්‍යවහාර නැවත සලකා බැලීමේ අවස්ථාවක් නිර්මාණය වී තිබේ. මේ තත්ත්වය නිල්ගල වනාන්තරය සම්බන්ධ ස්වාභාවික විද්‍යා සහ සමාජීය විද්‍යා පර්යේෂණවලට නව මාවත් විවර කර දී තිබේ.

## පරිශීලන නාමාවලිය

කරුණාරත්න, එම්. (2014). රුක් පැවිදි කිරීම මත ප්‍රජා වන කළමනාකරනය සඳහා බෞද්ධාගමික එළඹුමක් (නිල්ගල වනාන්තරයේ රුක් දරුවන් පැවිදි කිරීමේ වැඩසටහන ඇසුරිනි) සංස්කාරක. හෙළබොදුගම විහාවී. විදුමිණ ශාස්ත්‍රීය සංග්‍රහය. රුහුණ විශ්වවිද්‍යාලයේ භික්ෂු සංගමය. මාතර

දැරණියගල,එස්. (2003). ප්‍රාග් ඓතිහාසික සබරගමුව (බලංගොඩ සංස්කෘතිය), සබරගමුව වංශ කථාව : වෙළුම 1 සබරගමු පළාත් සභාවඃ රත්නපුර

පේමදාස, ඒ. (1999). සිරිලක තුරුලක. කර්තෘ ප්‍රකාශනඃ මාතර

මනමේන්ද්‍ර-ආරච්චි, කේ. (2022). ශ්‍රී ලංකාවේ දේශගුණික වෙනස්වීම්, ජීවී අනුවර්තන හා වඳවීම්. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයඃ කොළඹ

මනමේන්ද්‍ර-ආරච්චි, කේ. සහ පෙතියාගොඩ, ආර්. (2006). ශ්‍රී ලංකාවේ උභය ජීවීන්. උයඹ ප්‍රකාශනඃ කොළඹ

Ashton, M. S., Gunatilleke, S., De Zoysa, N., Dassanayake, M. D., Gunatilleke, N., & Wijesundera, S. (1997). *A field guide to the common trees and shrubs of Sri Lanka* (p. 430). Colombo, Sri Lanka: WHT Publications.

Cashore, B., Pohnan, E., & Stone, M. W. (2014). Impact of globalization on forest users: Trends and opportunities. The global forest sector: Changes, practices, and prospects, 35, 15-40.

Chamberlain, A. (2016). Pre-Homo sapiens place-worlds. In *Handbook of Landscape Archaeology* (pp. 102-108). Routledge.

Chandraratne, R. M. M. (2016). Some ethno-archaeological observations on the subsistence strategies of the veddas in Sri lanka. *Social Affairs: A Journal for the Social Sciences*, *1*(4), 2016.

Domínguez-Rodrigo, M. (2014). Is the "savanna hypothesis" a dead concept for explaining the emergence of the earliest hominins?. *Current Anthropology*, *55*(1), 59-81.

Fairservis, W. A. (1997). The Neolithic Transition: Hunting-Gathering to Sedentary Village Farming and Pastoralism. *Asia in Western and World History: A Guide for Teaching*, 217-235.

Ferreira, M. J., Levis, C., Chaves, L., Clement, C. R., & Soldati, G. T. (2022). Indigenous and traditional management creates and maintains the diversity of ecosystems of south american tropical savannas. *Frontiers in Environmental Science*, *10*, 809404.

Friends of the Earth International (2014). The story of tree ordination in Sri Lanka. https://www.foei.org/the-story-of-tree-ordination-in-sri-lanka/

Galvin, K. A., & Reid, R. S. (2010). People in savanna ecosystems: land use, change, and sustainability. *Ecosystem function in Savannas: Measurement and modeling at landscape to global scales*, 481-96.

Global Atlas of Environmental Justice (2014). Ordination of trees a peculiar from of mobilization from Sri Lanka.

Goonewardene, S., Hawke, Z., Vanneck, V., Drion, A., de Silva, A., Jayarathne, R., & Perera, J. (2003). Diversity of Nilgala Fire Savannah, Sri Lanka: with special reference to its herpetofauna. *Report of Project Hoona*, 1-29.

Gunatilleke, N., Pethiyagoda, R., & Gunatilleke, S. (2008). Biodiversity of Sri Lanka. *Journal of the National Science Foundation of Sri Lanka*, *36*(25), 25-61.

Hoare, R. E., & Du Toit, J. T. (1999). Coexistence between people and elephants in African savannas. *Conservation biology*, *13*(3), 633-639.

https://www.ejatlas.org/conflict/ordination-of-trees-a-peculiar-form-of-mobilization-from-sri-lanka

Johanson, D. (2001). Origins of Modern Humans: Multiregional or Out of Africa? https://brophy.net/Downloads/AIL%20Class%20on%20Reality%20&%20Unreality/READING%20MATERIAL%20IN%20PDF%20FORMAT/08%204originsofhomosapiens.pdf

Karunarathna, D. M. S. S., & Amarasinghe, A. T. (2007). Observations on the Breeding Behavior of Philautus regius Manamendra-Arachchi and Pethiyagoda, 2005 (Amphibia: Ranidae: Rhacophorinae) in Nilgala, Monaragala District in Sri Lanka. *Russian Journal of Herpetology*, *14*(2), 133-136.

Karunarathna, D. M. S. S., Abeywardena, U. I., Asela, M. C., & Kekulandala, L. D. C. B. (2008). A preliminary survey of the amphibian fauna in Nilgala

Forest area and its vicinity, Monaragala District, Sri Lanka. *Herpetological Conservation and Biology*, *3*(2), 264-272.

Karunarathna, D. M. S. S., Abeywardena, U. T. I., Asela, M. D. C., Sirimanna, D. G. R., & Kakulandala, L. (2006). A survey of amphibians in the nilgala forest reserve and its vicinity. *WILDLANKA Journal of the Department of Widllife Conservation of Sri Lanka*, *1*(1).

Karunarathna, D. M. S., & Amarasinghe, A. A. (2012). A preliminary survey of the reptile fauna in Nilgala forest and its vicinity, Monaragala District, Sri Lanka. *TAPROBANICA: The Journal of Asian Biodiversity*, *3*(2).

Karunarathna, D. M. S., Henkanaththegedara, S., Amarasinghe, A. A., & De Silva, A. (2013). Impact of vehicular traffic on herpetofaunal mortality in a savanna forest, eastern Sri Lanka. *Taprobanica: The journal of Asian biodiversity*, *5*(2).

Karunarathna, S., Bauer, A. M., De Silva, A., Surasinghe, T., Somaratna, L., Madawala, M., ... & Ukuwela, K. D. (2019). Description of a new species of the genus Cnemaspis Strauch, 1887 (Reptilia: Squamata: Gekkonidae) from the Nilgala savannah forest, Uva Province of Sri Lanka. *Zootaxa*, *4545*(3), 389-407.

Karunarathne,M. and Akurugoda,I.R. (2019) *Challenges and potentials of ecotourism practices: A case study of Sinharaja rainforest in Sri Lanka,*

International Union of Forest Research Organizations (IUFRO) 2019. Curitiba, Brazil.

Kumara, H. I. G. C., Wawwage, S., Yapa, L. G. D. S., & Karunarathne, M. L. M. L. (2017). Issues of Biopiracy Vs Community Based Forest Management: A Case Study on in the Nilgala Forest Reservation (Sri Lanka).

McKemey, M., Ens, E., Rangers, Y. M., Costello, O., & Reid, N. (2020). Indigenous knowledge and seasonal calendar inform adaptive savanna burning in northern Australia. *Sustainability*, *12*(3), 995.

Moloise, S. D., Matamanda, A. R., & Bhanye, J. I. (2024). Traditional ecological knowledge and practices for ecosystem conservation and management: the case of savanna ecosystem services in Limpopo, South Africa. *International Journal of Sustainable Development & World Ecology*, *31*(1), 29-42.

MoMD & E, (2019). Biodiversity Profile – Sri Lanka, Sixth National Report to the Convention on Biological Diversity, Biodiversity Secretariat, Ministry of Mahaweli Development and Environment, Sri Lanka. pp 200

Oldekop, J. A., Rasmussen, L. V., Agrawal, A., Bebbington, A. J., Meyfroidt, P., Bengston, D. N., ... & Wilson, S. J. (2020). Forest-linked livelihoods in a globalized world. Nature Plants, 6(12), 1400-1407.

Olorunfemi, F., Fasona, M., Oloukoi, G., Elias, P., & Adedayo, V. (2016). Traditional knowledge in the use and management of forest ecosystem for livelihoods and food security in Nigerian savanna. *Journal of Human Ecology*, *53*(2), 167-175.

Pemadasa, M. A. (1990). Tropical grasslands of Sri Lanka and India. *Journal of Biogeography*, 395-400.

Perera, N. P. (1975). The Human Influences on the Natural Vegetation of the Sri Lanka Highlands.Vidyodaya Journal, Vol; 05, 13-28.

Preece, N. D. (2013). Tangible evidence of historic Australian indigenous savanna management. *Austral Ecology*, *38*(3), 241-250.

Reid, W. V., Mooney, H. A., Cropper, A., Capistrano, D., Carpenter, S. R., Chopra, K., ... & Zurek, M. B. (2005). *Ecosystems and human well-being-Synthesis: A report of the Millennium Ecosystem Assessment*. Island Press.

Sousa Júnior, J. R., Albuquerque, U. P., & Peroni, N. (2013). Traditional knowledge and management of Caryocar coriaceum Wittm.(Pequi) in the Brazilian savanna, Northeastern Brazil. *Economic Botany*, *67*, 225-233.

Whitehead, P. J., Bowman, D. M., Preece, N., Fraser, F., & Cooke, P. (2003). Customary use of fire by indigenous peoples in northern Australia: its contemporary role in savanna management. *International Journal of Wildland Fire*, *12*(4), 415-425.

Wilson, A. S. C., Jayakody, S., & Padmalal, U. K. G. K. (2022). Potential for wild elephant-based ecotourism practices in and around Maduru Oya National Park. Journal of Tourism Economics and Applied Research. Special Issue on Biodiversity and Sustainable Tourism, 6, (II), 84-90.